# (ඉ) මුදල් හා බැංකු කටයුතු හැඩගැස්ම

1963 මුල්‍ය කටයුතු පිළිබඳ සිද්ධීන්, 1962 මෙන්ම එකිනෙකට ප්‍රතිවිරුද්ධ බලවේගයන් අනුව හැඩගැසී ගිය බව පෙනේ.[1] බාහිර ගනුදෙනු හේතුකොට රටතුළ ද්‍රවශීලතාවයෙහි (ශුද්ධ) අඩු වීමක් ඇතිවිය. එහෙත් බැංකු ක්‍රමයෙන් හා රජය විසින්, නිපදවන ලද ද්‍රවශීල තාවය නිසා මේ අඩුව පමණටත් වැඩියෙන් මැකීගියේය. මේ වෙනස්වීම් 1962 හැඩගැසුන අයුරින්ම හැඩ ගැසී ගියද, ප්‍රමාණයන් බොහෝ සෙයින්ම වෙනස්විය. බාහිර ද්‍රවශීල තාවයේ අඩුවීමත් සමග රටතුළ ද්‍රවශීල තාවයද අඩුවිය. අවුරුද්ද තුළ බදු මාර්ගයෙන් ඇති වූ ද්‍රවශීලතාවය ද 1962 ඇතිවූ ප්‍රමාණයට වඩා සැලකිය යුතු ලෙස අඩු විය. එහෙත්, දේශීය පෞද්ගලික අංශයට[2] බැංකු ක්‍රමයෙන් මවා දෙන ලද ණය ප්‍රමාණය බොහෝ සෙයින් වැඩි විය. 1963 දී රටතුළ ඇතිවූ මුළු ශුද්ධ ද්‍රවශීල තාවය, පසුගිය වසරේදීට වඩා බොහෝ සෙයින් වැඩි විය. පුළුල්ව බලන විට, 1963 වර්ෂය රටතුළ ද්‍රවශීල තාවය වේගයෙන් වැඩිවීගිය වර්ෂයක් විය.

මේ හැඩගැසීමට උචිත වන පරිදි, මහ බැංකු ප්‍රතිපත්තිය, ආර්ථික සංවර්ධනය සඳහා නියම වශයෙන් අවශ්‍යව ඇති, ණය පහසුකම් සලසා දීමත්, අලුත් පෙදෙස් හා පලාත් වලට, ණය පහසුකම් සලසා දීම සඳහා ඇවැසි ආයතන, පුළුල් කරලීමත් පදනම් කරගෙන පාලිතව පුලුල්වී යනායුරු සැකසුනක් විය යුතු විය. මේ සමගම, සමපෙක්ෂණ හා අනවශ්‍ය කටයුතු සඳහා නොමනා ලෙස, ණය 'පහසුව පුලුල්වීයාම ද සීමා කළ යුතු විය. පෞද්ගලික අංශයේ මුළු ද්‍රවශීලතා මට්ටම, ප්‍රසාරණයවීම නිසාත්, අර්ථ ක්‍රමයෙහි, මතුව ඇති නොයෙකුත් උද්ධමන බලපෑම් නිසාත්, අර්ථ ක්‍රමයෙහි ඒ ඒ අංශවලට වුවමනා ණය අවශ්‍යතා තක්සේරු කිරීමේදී, දක්විය යුතු, සැලකිල්ලත්, පරීක්ෂාකාරිත්වයත්, තවත් දැඩි කළ යුතු විය. 1963 ට පෙර තෝරා පනවන ලද ණය සීමා කිරීමේ නොයෙකුත්, පාලන ක්‍රම මාර්ගයෙන් හා, පෙළඹවීම් මාර්ගයෙන්, වර්ෂය තුළ ණය සීමා කිරීම් වඩාත් ප්‍රවේසමෙන් හා සැලකිල්ලෙන් කරගෙන යන ලදී. පොදු වශයෙන්, ණය ප්‍රසාරණය සීමාකිරීමේ අවශ්‍යතාවය ගැන අවබෝධයක් තුබූ අතර අර්ථ ක්‍රමයෙහි යම් යම් අංශවල දක්නට ලැබුන, සංවර්ධන උද්යෝගීතාවන්, සීමා කිරීමට ද බැංකුව, කැමැත්තක් දක්වූයේ නොවේ.

---

1. මෙහි දක්වෙන විග්‍රහයෙන්, මුදල් සැපයුමෙහි ව්‍යවහාර මුදල් හා ඉල්ලුම් තැන්පතු පමණක් නොව, සියලුම ද්‍රවශීල වත්කම් වල ඇති වූ වෙනස්කම් සාකච්ඡාවෙයි. ''මුදල්'' යන්නෙහි විග්‍රහයට, හැම වත්කම් වලටම වඩා වැඩියෙන් ද්‍රවශීලතාවයෙන් යුතු වත්කම් ගැනෙන්නේ වුවද, ඉතිරි කිරීම් හා ස්ථාවර තැන්පතු ද, කිසිම පාඩුවක් නොවිඳ මුදල් බවට නොපමාවම පරිවර්තනය කළ හැකිය. එම නිසා ඒවාද, මුදල් මෙන්ම ද්‍රවශීල ගණයට වැටේ. එසේම ''ආසන්න මුදල්'' වර්ග ද විශාල සංඛ්‍යාවක් ඇත්තේය. මේවාට සංචාරකයින් ගේ චෙක්, වාණිජ බිල්, භාණ්ඩාගාර බිල්, සහ මුදල් කළ හැකි, විකිණිය හැකි නොයෙකුත් වර්ගවල සුරැකුම් පත් ඇතුළත් වේ. මේ හැමෙකක්ම රජයට හෝ මුදල් ආයතන වලට හෝ ඉදිරිපත් කොට මුදල් ලබාගත හැකිය. ඉහත කී සුරැකුම්පත් වලින් වැඩි හරියක් රජයේ ණයපත් වලින් සමන්විත වෙයි. රජයේ ණයපත් වල ද්‍රව ශීල තාවය රැඳී පවත්නේ, ණය පත් නිකුත් කොට ඇති කොන්දේසි, කල් පිරීම, මහ බැංකු ප්‍රතිපත්තිය, හා සුරැකුම්පත් වෙළෙඳ පොළේ ඇති පූර්ණ තාවය අනුවය. රජයේ ණයපත්, අඩු දියුණු වෙළෙඳ පොළක දීට වඩා දියුණු වෙළෙඳ පොළක දී සාමාන්‍යයෙන් ද්‍රවශීලතාවයෙන් වැඩිය.

රැඩ්ක්ලිප් කමිටු වාර්තාවෙන් උපුටා පහත දක්වෙන පාඨය මේ සම්බන්ධයෙන් වැදගත් වෙයි.

''මුදල් සැපයුම මෙහිලා වැදගත් නොවන්නේයැයි අප නොසලකන අතර, එය, අර්ථ ක්‍රමයෙහි ද්‍රවශීලතා සැකසුමෙහි එක්තරා කොටසක් වශයෙන් පමණක් සලකමු. වියදම් කිරීමට කැරෙන තීරණයේ දී වැදගත් වන්නේ, මුළු ද්‍රවශීල තාවයයි. මුදල් සැපයුම කෙරෙහි අප සැලකිලිමත් වන්නේ මුළු ද්‍රවශීලතාවය කෙරෙහි එහි ඇති වැදගත් කම නිසා වෙයි''. (මූල්‍ය ක්‍රමය ක්‍රියා කරන අයුරු, පිළිබඳ කමිටුවේ වාර්තාව 1959; 132 වැනි පිටුවේ 389 ඡේදය)

මෙහි යොදු ඇති,

2. ''පෞද්ගලික අංශය'' යන්නෙන්, රජයේ සමායතන, පළාත්පාලන මණ්ඩල නොයෙකුත් අර්ධ රාජ්‍ය හා රජයේ අනුග්‍රහය ලැබූ ආයතන හා නියෝජ්‍යත්ව ඇතුළත් වෙයි. කොටින් කියතොත්, මහ ආණ්ඩුව, වෙළෙඳ බැංකු සහ මහ බැංකුව හැර අනෙකුත් සියලුම ආයතන ඇතුළත් වෙයි.

## 1. රටතුළ ද්‍රවශීලතා වර්ධනය :

ඉහත වැටිසන් කර ඇති නොයෙකුත් සාධකයන්ගේ බලපෑම් අනුව, බැංකු නොවන පෞද්ගලික අංශය සතුව ඇති, මුළු ද්‍රවශීලවත්කම් ප්‍රමාණය, 1963 දී රුපියල් කෝටි 28.7 කින් පමණ හෝ සියයට 11 කින් පමණ වැඩිවිය. 1962 [1] දී මෙය වැඩි වී ඇත්තේ රුපියල් කෝටි 14.6 කින් හෙවත්, සියයට 5.8 කින් පමණෙකි. එක් අයෙකුට වැටෙන ද්‍රවශීලතා ප්‍රමාණය ද 1962 දී රු. 253.9 ක් වූ අතර, 1963 දී රු. 274.3 ට වැඩි විය. 1962 දී සියයට 3.0 කින් පමණක් වැඩි වූ මෙය 1963 වන විට, සියයට 8.0 කින් පමණ වැඩිවී ඇති බව පිළිබිඹු වෙයි. ලංකාවේ ජාතික ආදායම නාමික වශයෙන් සියයට 4.8 කින් වැඩිවී ඇතැයි (මූර්ත වශයෙන් සියයට 1.8 ක් පමණයැයි ඇස්තමේන්තු කර ඇත.) රටෙහි ප්‍රධාන ද්‍රවශීලතා අනුපාතයන්, II ඉ — 1 වැනි සටහනේ දක්වා ඇති පරිදි සැලකිය යුතු අන්දමින් වැඩි වී ඇත.

සංඛ්‍යා සටහන II ඉ—I

### බැංකු නොවන පෞද්ගලික අංශයේ මුළු ද්‍රවශීල වත්කම් ප්‍රමාණය 1961 - 1963

| විස්තර | ප්‍රමාණය (රුපියල් දශ ලක්ෂ) | | | දළ ජාතික නිෂ්පාදිතයෙහි සියයට ගණන වශයෙන් (අ) | | |
|---|---|---|---|---|---|---|
| | 1961 | 1962 | 1963 | 1961 | 1962 | 1963 |
| 1. මූලික ද්‍රවශීල වත්කම් | | | | | | |
| (අ) නෝට්ටු හා කාසි .. .. .. | 692·2 | 712·6 | 828·4 | 11·3 | 11·1 | 12·3 |
| (ආ) ඉල්ලුම් තැන්පතු .. .. .. | 596·4 | 630·0 | 677·7 | 9·7 | 9·8 | 10·1 |
| එකතුව .. .. .. .. | 1288·6 | 1342·7 | 1506·0 | 21·0 | 20·9 | 22·4 |
| වෙනසෙහි සියයට ගණන .. .. | | +4·2 | +12·2 | | | |
| 2. ද්විතීය ද්‍රවශීල වත්කම් | | | | | | |
| (අ) වෙළෙඳ බැංකු වෙතැති ඉතිරිකිරීම් තැන්පතු .. .. .. | 130·6 | 140·9 | 165·2 | 2·1 | 2·2 | 2·5 |
| (ආ) තැපැල් කන්තෝරු සේවිංස් බැංකුව වෙතැති ඉතිරි කිරීම් තැන්පතු .. | 351·9 | 362·3 | 368·5* | 5·7 | 5·6 | 5·5 |
| (ඇ) ලංකා ඉතිරිකිරීමේ සේවින්ස් බැංකුව වෙතැති ඉතිරි කිරීම් තැන්පතු .. | 75·3 | 75·4 | 75·1* | 1·2 | 1·2 | 1·1 |
| (ඈ) වෙළෙඳ බැංකු වෙතැති කැලීන තැන්පතු | 223·8 | 263·7 | 302·8 | 3·6 | 4·1 | 4·5 |
| (ඉ) මෙරට පදිංචිකරුවන් සතු විදේශීය ශේෂ | 19·6 | 21·0 | 13·6* | 0·3 | 0·3 | 0·2* |
| (ඊ) ඉතිරි කිරීම් සහතික .. .. | 32·7 | 32·9 | 34·4* | 0·5 | 0·5 | 0·5 |
| (උ) භාණ්ඩාගාර බිල් .. .. .. | 5·8 | 2·8 | 0·5 | 0·1 | ... | ... |
| (ඌ) බදු සංචිත සහතික .. .. .. | 17·1 | 17·2 | 25·3 | 0·3 | 0·3 | 0·4 |
| (ඒ) රජයේ බැඳුම්කර .. .. .. | 359·6 | 392·5 | 446·6 | 5·9 | 6·1 | 6·6 |
| එකතුව .. .. .. | 1216·4 | 1308·7 | 1432·0* | 19·8 | 20·4 | 21·3 |
| වෙනසෙහි සියයට ගණන .. .. | | +7·6 | + 9·4 | | | |
| 3. පෞද්ගලික අංශයේ මුළු ද්‍රවශීල වත්කම් .. | 2505·0 | 2651·4 | 2938·0* | 40·8 | 41·3 | 43·7 |
| වෙනසෙහි සියයට ගණන .. .. | | +5·8 | +10·8 | | | |
| ඉහත සංඛ්‍යා වලට තැපැල් කන්තෝරු සේවින්ග්ස් බැංකුව, ලංකා සේවින්ග්ස් බැංකුව, සේවක අර්ථ සාධක අරමුදල ආදී රජයේ මූල්‍ය ආයතන වෙතැති භාණ්ඩාගාර බිල් හා රජයේ ණයපත් ඇතුළත් කොට නොමැත... .. .. | 698·0 | 764·4 | 886·6 | 11·4 | 11·9 | 13·2 |

*ඇස්තමේන්තු කළ

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

(අ) පවත්නා සාධක වියදම් මිල අනුව

1. ''මුළු ද්‍රවශීලතා'' යන්නට දී ඇති අර්ථනිරූපනයට රජයේ ණයපත් ඇතුළු නො කරන්නේ නම්, 1963 දී වැඩි වූ ද්‍රවශීලතා ප්‍රමාණය, රුපියල් කෝටි 23·25ක් හෙවත්, සියයට 10·3කි. 1962 වැඩි වූ ප්‍රමාණය රුපියල් කෝටි 11.34 හෙවත් සියයට 5·3කි. අනෙක් අතට, තැපැල් කන්තෝරු ඉතිරි කිරීමේ බැංකුව, ලංකා ඉතිරි කිරීමේ බැංකුව, සේවක අර්ථ සාධක අරමුදල, ආදී මූල්‍ය කටයුතු සඳහාම ඇරුන ආයතන සතු රජයේ ණයපත් ද, ඊට ඇතුළත් කරන්නේ නම් 1963 ඇති වූ වැඩිවීම රුපියල් කෝටි 40·88ක් හෙවත් සියයට 12·0ක් වෙයි. 1962 දී ඇතිවූ වැඩිවීම රුපියල් කෝටි 21·27ක් හෙවත්, සියයට 6·6ක් වෙයි.

1963 වැඩිවූ මුළු ද්‍රවශීල වත්කම්, ප්‍රධාන වශයෙන්ම මහජනයා සතු නෝට්ටු හා කාසි ද වෙළෙඳ බැංකු සතු තැන්පතු ද රජයේ ණයපත් ද වැඩිවීමෙන් සමන්විත විය. 1963 දී මුදල් නෝට්ටු හා කාසි රුපියල් කෝටි 11.58 කින් හෙවත් සියයට 16.2 කින් වැඩිවිය. මෙය 1962 දී වැඩි වී ඇත්තේ, රුපියල් කෝටි 2.04 කින් හෙවත්, සියයට 2.9 කින් පමණෙකි. වෙළෙඳ බැංකු වෙතැති, ඉල්ලුම් තැන්පතු රුපියල් කෝටි 4.77 කින් හෙවත්, සියයට 7.6 කින් වැඩිවිය. පසුගිය අවුරුද්දේ වැඩි වූ ප්‍රමාණය රුපියල් කෝටි 3.36 ක් හෙවත් සියයට 5.6 ක් විය. මුළු වශයෙන් මුදල් සැපැයුම රුපියල් කෝටි 16.33 කින් හෙවත් සියයට 12.2 කින් වැඩිවිය. 1962 මෙය වැඩි වී ඇත්තේ, රුපියල් කෝටි 5.40 කින් හෙවත් සියයට 4.2 කිනි. වෙළෙඳ බැංකු වෙතැති, කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු රුපියල් කෝටි 6.34 කින් හෙවත් සියයට 15.7 කින් ඉහළ ගියේය. 1962 දී ඇතිවූ අනුරූප වැඩිවීම රුපියල් කෝටි 5.02 ක් හෙවත්, සියයට 14.2 කි. පෞද්ගලික අංශය සතු රජයේ ණයපත්, රුපියල් කෝටි 5.41 කින් හෙවත් සියයට 13.8 කින් වැඩි විය. 1962 දී මේ වැඩි වූයේ රුපියල් කෝටි 3.29 කින් හෙවත් සියයට 9.1 කිනි.

1963 දී මුළු ද්‍රවශීල වත්කම් වල සහ, ද්‍රවශීලතා අනුපාතයන්හි වර්ධනයත් සමග, ඉහත දක්වා ඇති පරිදි, වත්කම් සැකැස්මෙහි ද වෙනස්කම් ඇති විය. ස්ථාවර සහ ඉතිරි කිරීම් තැන්පතු මෙන්ම, රජයේ ණයපත් වැඩි වුවද, ද්විතීයික ද්‍රවශීල වත්කම් වලට වඩා වැඩි සැලකිල්ලක් දක්වා ඇත්තේ ප්‍රාථමික ද්‍රවශීල වත්කම් කෙරෙහි ය. මුළු ද්‍රවශීල වත්කම් වලට මුදල් සැපැයුමෙහි වූ අනුපාතය 1962 දී සියයට 50.6 ක් වූ අතර 1963 දී සියයට 51.3 ක් විය. මුළු මුදල් සැපැයුමට, පෞද්ගලික අංශය සතු නෝට්ටු හා කාසි වල අනුපාතය ද සියයට 53.1 සිට සියයට 55.0 තෙක් වැඩි විය. කොටින් කියතහොත්, 1963 දී රට තුළ ද්‍රවශීලතාවය ප්‍රමාණාත්මකව මෙන්ම ගුණාත්මකව ද වෙනස් වී ඇත.

1963 වැඩි වූ මුළු ද්‍රවශීලවත්කම් ප්‍රමාණය, පෞද්ගලික අංශයේ ඒ ඒ ආර්ථික පංති අතර, කෙසේ බෙදී ගියේද යන්න ලැබී ඇති සංඛ්‍යා තොරතුරු අනුව දැක්විය හැක්කේ නොවේ. IIඉ—1 සංඛ්‍යා සටහනින් පිළිබිඹු වන පරිදි, 1963 දී රුපියල් කෝටි 5.41 කින් වැඩි වූ රජයේ ණයපත් මුළුමනින් ම, භාරකාර, සුභසාධක, විශ්‍රාම සහ අර්ථසාධක අරමුදල්[1] (රුපියල් කෝටි 2.94) රක්ෂණ අංශය (රුපියල් කෝටි 2.2) සහ පුද්ගලයන් (රුපියල් කෝටි 0.1 සතු ණයපත් වැඩිවීම්වලින් සමන්විත විය. වෙළෙඳ බැංකු තැන්පතු සම්බන්ධයෙන් ඇති තතු 1962 සහ 1963 වර්ෂය සඳහා කැරුන සමීක්ෂණයේ සංඛ්‍යා අනුව II ඉ—2 වැනි සංඛ්‍යා සටහනේ පිඩු කොට දක්වා ඇත.

සංඛ්‍යා සටහන II ඉ—2

## වෙළෙඳ බැංකු වෙත ඇති පෞද්ගලික අංශයේ තැන්පතු, ආර්ථික පංති අනුව විග්‍රහ කොට

රුපියල් දශ ලක්ෂ

| | 1962 | 1963 | එකතුව |
|---|---|---|---|
| 1. බැංකු නොවන මූල්‍ය ආයතන .. | +10·5 | — 5·0 | + 5·5 |
| 2. වැවිලි .. .. .. | —14·6 | —18·8 | — 33·4 |
| 3. වෙළෙඳ ආයතන .. .. | +26·7 | +65·0 | + 91·7 |
| 4. අනෙකුත් ව්‍යාපාර .. .. | +41·2 | —14·0 | + 27·2 |
| 5. පලාත් පාළන ආයතන .. .. | —10·4 | +16·6 | + 6·2 |
| 6. ව්‍යාපාර නොවන ආයතන .. | +10·8 | +31·9 | + 42·7 |
| 7. පුද්ගලයන් .. .. .. | +25·7 | +36·7 | + 62·4 |
| වෙනසෙහි එකතුව .. .. | +89·8 | +112·5 | +202·3 |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

1. සේවක අර්ථ සාධක අරමුදල ඇතුළත් නොවේ.

## 1. (අ) මුදල් සැපයුම

1963 දී මුදල් සැපයුම රුපියල් කෝටි 134.27 සිට රුපියල් කෝටි 150.60 දක්වා රුපියල් කෝටි 16.33 කින් හෙවත් සියයට 12.2 කින් වැඩි විය. 1962 දී වැඩි වූයේ රුපියල් කෝටි 5.4 කින් හෙවත් සියයට 4.2 කිනි. 1963 දී මුදල් සැපැයුමෙහි සාමාන්‍ය මාසික වැඩිවීම රුපියල් කෝටි 1.36 ක් විය. 1962 දී මෙහි වැඩි වීම රුපියල් කෝටි 0.45 ක් විය. IIඉ—1 වැනි සංඛ්‍යා සටහනේ දක්වා ඇති පරිදි, 1963 රට තුළ ඇති වූ මුළු ද්‍රවශීලතා වර්ධනයෙහි ඉතාමත් සැලකිය යුතු ලක්ෂණය වූයේ මුදල් සැපැයුමෙහි වැඩි වීමය. මුදල් සැපැයුම පෞද්ගලික අංශයට ගොනු වූ වැඩි වූ මුළු ද්‍රවශීලතා වත්කම් වලින් සියයට 57 ක් පමණ විය. එහෙත් රටතුළ ද්‍රවශීලතා වර්ධනය මෙයට බොහෝ අඩු වූ 1962 වර්ෂයේ දී මුදල් සැපැයුම වැඩි වූ මුළු ද්‍රවශීලතා වත්කම් වලින් සියයට 37 ක් පමණක් විය. 1963 දී, මුළු වශයෙන් රුපියල් කෝටි 16.33 කින් වැඩි වූ මුදල් සැපැයුමෙන් සියයට 71 ක් ම නෝට්ටු හා කාසි වලින් සමන්විත විය. එහෙත් 1962 දී නෝට්ටු හා කාසි ප්‍රමාණය වැඩි වූ මුළු මුදල් ප්‍රමාණයෙන් සියයට 38 ක් පමණක් විය. මුළු මුදල් වලට වූ නෝට්ටු හා කාසි අනුපාතය, 1962 සියයට 53.1 ක් වූ අතර 1963 දී සියයට 55.0 තෙක් වැඩි විය.

සංඛ්‍යා සටහන II ඉ—3

### මුදල් සැපැයුම් සැකැසුම

රුපියල් දශ ලක්ෂ

| කාලඡෙදය අවසානයේදී | මහජනයා සතු නෝට්ටු හා කාසි | | මහජනයා සතු ඉල්ලුම් තැන්පතු | | මුළු මුදල් සැපැයුම |
|---|---|---|---|---|---|
| | ප්‍රමාණය | මුළු මුදල් සැපැයුමෙහි සියයට ගණන | ප්‍රමාණය | මුළු මුදල් සැපැයුමෙහි සියයට ගණන | |
| 1953 .. .. | 335·3 | 40·6 | 491·5 | 59·4 | 826·8 |
| 1954 .. .. | 341·8 | 35·7 | 615·3 | 64·3 | 957·1 |
| 1955 .. .. | 384·5 | 35·8 | 688·4 | 64·2 | 1,072·9 |
| 1956 .. .. | 401·1 | 35·6 | 725·7 | 64·4 | 1,126·8 |
| 1957 .. .. | 434·9 | 41·8 | 605·2 | 58·2 | 1,040·1 |
| 1958 .. .. | 529·8 | 49·2 | 546·9 | 50·8 | 1,076·8 |
| 1959 .. .. | 565·0 | 48·0 | 612·7 | 52·0 | 1,177·7 |
| 1960 .. .. | 595·3 | 49·2 | 613·6 | 50·8 | 1,208·9 |
| 1961 .. .. | 692·2 | 53·8 | 596·4 | 46·2 | 1,288·6 |
| 1962 .. .. | 712·6 | 53·1 | 630·0 | 46·9 | 1,342·7 |
| 1963 .. .. | 828·4 | 55·0 | 677·7 | 45·0 | 1,506·0 |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

මේ අනුව, 1963 දී ඉල්ලුම් තැන්පතු වල (මේ තැන්පතු 1963 දී සියයට 7.6 කින් වැඩි විය.) සහ පෞද්ගලික අංශය සතු නෝට්ටු හා කාසි වල වැඩිවීම දළ ජාතික නිෂ්පාදිතයේ නාමික වශයෙන් ඇති වූ වර්ධනයට වඩා සැලකිය යුතු ලෙස වැඩිවිය. 1963 නෝට්ටු හා කාසි සඳහා ඉල්ලුම වැඩි වූයේ බොහෝදුරට මුදල් සඟවා තබා ගැනීමේ අදහස නිසා ය යන්න, නෝට්ටු හා කාසි ප්‍රාසාරණයේ සැකැසුම හදරන විට නොහැහෙන්නේ නොවේ. 1963 දී, රුපියල් 100 සහ රු. 50/- නෝට්ටු රුපියල් කෝටි 8.70 කින් (සියයට 20.5 කින්) වැඩි විය. මෙය භාවිතයේ තිබෙන නෝට්ටු හා කාසි වලින් සියයට 78.0 ක් වෙයි. තව ද, භාවිතයේ තිබෙන නෝට්ටු හා කාසි වලට මේ මුදල් නෝට්ටු දෙවර්ගයේ ඇති අනුපාතය මෑත වර්ෂ වල දී වැඩි වෙමින් තිබිණ. 1962 සියයට 53.8 ක් වූ මෙය 1963 වන විට සියයට 56.8 දක්වා වේගයෙන් වැඩි විය.

1962 දී ලංකාවේ දළ ජාතික නිෂ්පාදිතය, මූර්ත වශයෙන් සියයට 3.7 කින් හා නාමික වශයෙන් සියයට 4.5 කින් වැඩි වී ඇතැයි ඇස්තමේන්තු කොට ඇත. එම වර්ෂයේ දී මුදල් සැපැයුම සියයට 4.2 කින් ප්‍රාසාරණය විය. අනෙක් අතට, 1963 දී තාවකාලික ඇස්තමේන්තු අනුව දළ ජාතික නිෂ්පාදිතය මූර්ත වශයෙන් සියයට 1.8 කින් සහ නාමික වශයෙන් සියයට 4.8කින් වැඩි වී ඇති අතර, මුදල් සැපැයුම සියයට 12.2 කින් වැඩි වී ඇත. පවත්නා සාධක වියදම් මිල අනුව වූ දළ ජාතික නිෂ්පාදිතයට, මුදල් සැපැයුමෙහි වූ අනුපාතය, (රට තුළ ඇති ද්‍රවශීලතාවය මැනීමෙහි දී ගැනීමට තිබෙන එකම සැලකිය යුතු මිම්ම මෙය විය හැකිය.) 1962 දී සියයට 21.0 ක් වූ අතර, 1963 වන විට සියයට 22.4 කට වැඩි විය. මුදල් සැපැයුමේ එක් අයෙකුට වැටෙන කොටස, රුපියල් 128.6 සිට රු. 140.6 දක්වා සියයට 9.3 කින් වැඩි විය.

මුදල් සැපැයුමෙහි ඇති වූ වෙනස්කම් විග්‍රහ කිරීම සඳහා මුළු මහජන ගනුදෙනු පුළුල් වශයෙන් කොටස් තුනකට ලෙහෙසියෙන් වෙන් කළ හැකිය. (i) බාහිර ලෝකයේ රටවල් සමග ඇති ගනුදෙනු—මෙය මහ බැංකුවේ සහ වෙළෙඳ බැංකු වල වත්කම් ඇතුළුව, බැංකු විදේශීය වත්කම් වෙනස්වීමෙන් දළ වශයෙන් පිළිබිඹු වෙයි. (ii) මෙරට වෙළෙඳ බැංකු වල ශුද්ධ ගනු දෙනු—මෙය බැංකු වලින් මවා දෙන ණය සහ ඒ අනුව, පෞද්ගලික අංශයෙන් මැවෙන ණය, කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු වල වෙනස්වීම් අනුව ගලපා ගත්විට පිළිබිඹු වෙයි. (iii) රජය විසින් රටතුළ කැරෙන ගනුදෙනු—මෙය රජයේ රුපියල් ශේෂ වෙනස්වීම අනුව ගලපා මහ බැංකුවෙන් හා වෙළෙඳ බැංකු වලින් රජයට කැරෙන ණය ප්‍රාසාරණයෙන් හෝ සංකෝචනයෙන් පිළිබිඹු වෙයි. වෙළෙඳ බැංකු පෞද්ගලික අංශයට සුරැකුම්පත් විකිණීමත්, ඒ අංශයෙන් සුරැකුම්පත් මිලයට ගැනීමත් කැරෙන නිසා බැංකු සතුව ඇති රජයේ ණයපත් වල ඇති වන ශුද්ධ වෙනස්වීමකින් බැංකු විසින් රජයට දී ඇති ණය වල ඇති වූ වෙනස පිළිබිඹු වෙතැයි අවශ්‍යයෙන් ම කිව හැක්කේ නොවේ. එහෙත්, 1963 දී එවැනි ගනුදෙනු සැලකිය යුතු ප්‍රමාණයකින් නොවුන නිසා පූර්වෝක්ත කරුණ නොතකා හැරිය හැකිය. 1958 සිට 1963 දක්වා වූ එක් එක් වර්ෂය සඳහා මේ අනුව කැරුන විග්‍රහයක් II ඉ—4 වැනි සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

සංඛ්‍යා සටහන II ඉ—4

# මුදල් සැපැයුමෙහි වෙනස්වීම්

රුපියල් දශ ලක්ෂ

| මුදල් සැපැයුම කෙරෙහි බලපාන සාධක | 1957/58 දෙසැම්බර් අග දක්වා | | 1958/59 දෙසැම්බර් අග දක්වා | | 1959/60 දෙසැම්බර් අග දක්වා | | 1960/61 දෙසැම්බර් අග දක්වා | | 1961/62 දෙසැම්බර් අග දක්වා | | 1962/63 දෙසැම්බර් අග දක්වා | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රසාරණ හේතූන් | සංකෝචන හේතූන් | ප්‍රසාරණ හේතූන් | සංකෝචන හේතූන් | ප්‍රසාරණ හේතූන් | සංකෝචන හේතූන් | ප්‍රසාරණ හේතූන් | සංකෝචන හේතූන් | ප්‍රසාරණ හේතූන් | සංකෝචන හේතූන් | ප්‍රසාරණ හේතූන් | සංකෝචන හේතූන් |
| 1. බැංකු සතු විදේශීය වත්කම් (ශුද්ධ) .. .. .. .. | — | 82·2 | — | 195·0 | — | 170·2 | — | 78·6 | — | 91·1 | — | 53·2 |
| 2. වෙළෙඳ බැංකු ගනුදෙනු:— | | | | | | | | | | | | |
| (අ) පෞද්ගලික අංශයට දුන් ණය .. .. .. .. | 53·4 | — | 9·7 | — | 31·5 | — | 12·5 | — | 42·2 | — | 124·2 | — |
| (ආ) අතැති භාණ්ඩාගාර බිල් සහ රජයේ හා රජය ඇප වූ සුරැකුම්පත් .. | — | 39·6 | 30·2 | — | 6·0 | — | 21·4 | — | 71·3 | — | — | 5·4 |
| (ඇ) කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු .. .. .. .. | — | 38·5 | — | 34·8 | — | 52·8 | 8·4 | — | — | 62·6 | — | 63·4 |
| (ඈ) වෙළෙඳ බැංකුවල අනෙකුත් වගකීම් (ශුද්ධ) .. .. .. | — | 29·6 | 11·6 | — | — | 19·7 | — | 28·0 | 11·7 | — | 33·9 | — |
| 3. මහ බැංකු ගනුදෙනු | | | | | | | | | | | | |
| (අ) රජයට දුන් ණය .. .. .. .. .. .. | 75·0 | — | 61·8 | — | 21·9 | — | 1·9 | — | 3·0 | — | 7·0 | — |
| (ආ) අතැති භාණ්ඩාගාර බිල් සහ රජයේ හා රජය ඇප වූ සුරැකුම්පත් .. | 100·6 | — | 191·0 | — | 224·3 | — | 140·8 | — | 175·9 | — | 139·5 | — |
| (ඇ) අනෙකුත් වත්කම් හා ගිණුම් (ශුද්ධ) .. .. .. | 24·5 | — | — | 27·9 | — | 19·3 | — | 9·1 | — | 18·6 | — | 10·7 |
| 4. රජයේ මුදල් ශේෂ .. .. .. .. .. .. | — | 36·4 | 64·0 | — | 8·0 | — | 9·4 | — | — | 76·1 | — | 8·3 |
| 5. ගැලපිලි .. .. .. .. .. .. .. | 9·6 | — | — | 9·6 | 1·4 | — | 1·0 | — | — | 1·7 | — | 0·2 |
| ප්‍රසාරණ/සංකෝචන සාධක එකතුව .. .. .. .. | 263·1 | 226·3 | 368·3 | 267·3 | 293·1 | 262·0 | 195·4 | 115·7 | 304·1 | 250·1 | 304·6 | 141·2 |
| මුදල් සැපැයුමෙහි වෙනස .. .. .. .. | +36·6 | | +101·0 | | +31·1 | | +79·8 | | +54·0 | | +163·3 | |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

සංඛ්‍යා සටහන II ඉ—5

## මුදල් සැපැයුම

රුපියල් දශ ලක්ෂ

| කාලච්ඡේදය අවසානයේදී | 1958 | 1959 | 1960 | 1961 | 1962 | 1963 | (1958 න් 1959 ට වූ) වෙනස % | (1959 න් 1960 ට වූ) වෙනස % | (1960 න් 1961 ට වූ) වෙනස % | (1961 න් 1962 ට වූ) වෙනස % | (1962 න් 1963 ට වූ) වෙනස % |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ජනවාරි .. .. | 1,014 | 1,050 | 1,180 | 1,207 | 1,426 | 1,347 | + 3·6 | +12·4 | + 2·3 | +18·1 | − 5·5 |
| පෙබරවාරි .. .. | 1,016 | 1,053 | 1,192 | 1,193 | 1,561 | 1,369 | + 3·6 | +13·2 | + 0·1 | +30·8 | −12·3 |
| මාර්තු .. .. | 1,023 | 1,089 | 1,194 | 1,210 | 1,635 | 1,385 | + 6·5 | + 9·6 | + 1·3 | +35·1 | −15·6 |
| අප්‍රේල් .. .. | 1,032 | 1,084 | 1,165 | 1,306 | 1,448 | 1,400 | + 5·0 | + 7·5 | +12·1 | +10·9 | − 3·3 |
| මැයි .. .. | 1,000 | 1,096 | 1,163 | 1,219 | 1,317 | 1,431 | + 9·6 | + 6·1 | + 4·8 | + 8·0 | + 8·6 |
| ජූනි .. .. | 1,015 | 1,094 | 1,170 | 1,221 | 1,298 | 1,448 | + 7·9 | + 6·9 | + 4·4 | + 6·3 | +11·5 |
| ජූලි .. .. | 1,023 | 1,094 | 1,150 | 1,223 | 1,277 | 1,447 | + 6·9 | + 5·1 | + 6·3 | + 4·4 | +13·3 |
| අගෝස්තු .. .. | 1,022 | 1,095 | 1,161 | 1,231 | 1,270 | 1,474 | + 7·1 | + 6·0 | + 6·0 | + 3·2 | +16·1 |
| සැප්තැම්බර් .. | 1,072 | 1,128 | 1,181 | 1,261 | 1,294 | 1,499 | + 5·2 | + 4·7 | + 6·8 | + 2·6 | +15·8 |
| ඔක්තෝබර් .. .. | 1,085 | 1,153 | 1,212 | 1,248 | 1,317 | 1,505 | + 6·3 | + 5·1 | + 3·0 | + 5·5 | +14·3 |
| නොවැම්බර් .. | 1,070 | 1,170 | 1,219 | 1,251 | 1,307 | 1,533 | + 9·3 | + 4·2 | + 2·6 | + 4·5 | +17·3 |
| දෙසැම්බර් .. .. | 1,077 | 1,178 | 1,209 | 1,289 | 1,343 | 1,506 | + 9·4 | + 2·6 | + 6·6 | + 4·2 | +12·2 |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

පෞද්ගලික අංශය සමග, ඇති වූ බාහිර ගනුදෙනු රජයේ ගනුදෙනු හා වෙළෙඳ බැංකු ගනුදෙනු නිසා මුදල් සැපයුම කෙරෙහි 1963 ඇති වූ බලපෑම පසුගිය අවුරුද්දේ පිළිවෙළම අනුගමනය කළ ද, ප්‍රමාණයන් අතින් වෙනස් වී ඇති බව දක්ක හැකිය. බාහිර ගනුදෙනු නිසා 1963 දී මුදල් සැපයුම අඩු වූයේ රුපියල් කෝටි 5.32 කින් පමණෙකි. 1962 දී මෙය රුපියල් කෝටි 9.11 කින් අඩුවිය. (1961 දී අඩු වූ ප්‍රමාණය රු. කෝටි 7.86 කි.) 1963 දී බැංකු වත්කම් අඩු වශයෙන් පහළ වැටීම, බොහෝ සෙයින්ම, බලපවත්වමින් තුබුන ආනයන සීමා කිරීම් නිසා උද්ගත විය. රජයේ අය වැය හිඟයන් නිසා 1963 දී මුදල් සැපැයුම කෙරෙහි ඇතිවූ ප්‍රාසාරණාත්මක බලපෑම අඩු විය. 1962 දී රුපියල් කෝටි 17.41 ක් වූ මෙය 1963 දී රුපියල් කෝටි 13.28 ක් විය. (1961 දී රුපියල් කෝටි 17.35 ක් විය.) වෙළෙඳ බැංකු වලින්, ප්‍රධාන වශයෙන්ම, ලාංකික බැංකු වලින් පෞද්ගලික අංශයට දෙනලද ණය 1963 දී රුපියල් කෝටි 12.42 කින් වේගයෙන් වැඩිවිය. 1962 දී මෙසේ වැඩිවූ ප්‍රමාණය රුපියල් කෝටි 4.22 ක් වූ අතර, 1961 දී රුපියල් කෝටි 1.25 ක් විය. එහෙත් වෙළෙඳ බැංකු වෙතැති, කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු ප්‍රාථමික ද්‍රවශීල තාවයෙහි හෙවත් මුදල් සැපැයුමෙහි ඇති වූ ප්‍රාසාරණය රුපියල් කෝටි 6.34 කින් අඩුකර ලීය. 1962 දී ද එවැනිම ප්‍රමාණයකින් (රුපියල් කෝටි 6.26 කින්) අඩු කරලීය. (1961 දී මේ තැන්පතු රුපියල් කෝටි 0.84 කින් අඩුවිය.) මේ අනුව, බාහිර ද්‍රවශීලතාවය අඩුවීමෙන් හා කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු වැඩිවීමෙන් 1963 දී රටතුළ මුදල් සැපැයුම කෙරෙහි ඇතිවූ සංකෝචන බලපෑම, වෙළෙඳ බැංකු විසින් ණය මවා දීමෙන් හා අය වැය හිඟය නිසා රජය විසින් කැරුන වියදම් වලින් උද්ගත වූ ප්‍රාසාරණාත්මක බලපෑම මකාලීමට තරම් ප්‍රමාණවත් වූයේ නොවේ. මෙහි පල විසින් මුදල් සැපැයුම රුපියල් කෝටි 16.33 කින් වැඩිවිය.

1962 දී මෙන් නොව, 1963 දී මුදල් සැපැයුම, ජූලි සහ දෙසැම්බර් මාස වලදී හැර අනෙක් සැම මාසයකදීම වැඩිවිය. II ඉ—4 වැනි සංඛ්‍යා සටහනේ දක්වා ඇති සංඛ්‍යා තොරතුරු වලට පරිපූරකව, II ඉ—6 වැනි සංඛ්‍යා සටහනින් හා කාර්තු වශයෙන් මුදල් ප්‍රමාණයෙහි ඇතිවූ වෙනස්කම් අනු ව එහිකර ඇති විග්‍රහයෙන්, මේ සඳහා තුඩු දුන්, ප්‍රධාන සාධක වල එකිනෙකට ඇති වැදගත්කම, අවුරුද්දේ ඒ ඒ අවස්ථා වල දී වෙනස් වී ගිය බව, හෙළිවෙයි.

සංඛ්‍යා සටහන II ඉ—6

## 1963 මුදල් සැපැයුමෙහි වෙනස්වීම් කාර්තු අනුව

රුපියල් දශ ලක්ෂ

| | පළමු වැනි කාර්තුව | දෙ වැනි කාර්තුව | තෙ වැනි කාර්තුව | සිව් වැනි කාර්තුව | එකතුව |
|---|---|---|---|---|---|
| විදේශීය බැංකු වත්කම් (ශුද්ධ) .. | +66·7 | +24·1 | − 51·2 | −92·9 | − 53·2 |
| රජයේ ගනුදෙනු .. .. .. | − 1·9 | −23·2 | +107·8 | +49·9 | +132·8 |
| වෙළෙඳ බැංකු හර .. .. | −12·9 | +54·1 | + 25·1 | +57·9 | +124·2 |
| කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු .. | −11·7 | − 1·2 | − 28·8 | −21·8 | − 63·4 |
| මුදල් සැපැයුමෙහි වෙනස .. .. | +42·6 | +62·6 | + 51·4 | + 6·7 | +163·3 |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

මුල් මාස තුනේදී, රුපියල් කෝටි 4.26 කින් වැඩි වූ මුදල් සැපැයුම කෙරෙහි, ප්‍රධාන වශයෙන්ම, බැංකු විදේශීය වත්කම් ප්‍රාසාරණය, බලපා ඇති අතර, බැංකු ණය අඩු වීමත් කාලීන තැන්පතු වැඩිවීමත් නිසා සැලකිය යුතු සංකෝචන බලපෑමක් ද ඇති විය. දෙවැනි කාර්තුවේදී මුදල් සැපැයුම රුපියල් කෝටි 6.26 කින් වැඩි කිරීමෙහි ලා බලපෑවැත් වූ ප්‍රධාන සාධකය වූයේ බාහිර ද්‍රවශීලතාවය තවදුරටත් වැඩිවීමත් සමග බැංකු ණය වැඩිවීමය. එහෙත් රාජ්‍ය අංශයේ ඇති වූ සංකෝචන බලපෑම නිසා මෙය තරමක් දුරට මැකී ගියේය. තුන්වැනි කාර්තුවේ දී අනෙකුත් බලපෑම් අභිබවා රජයේ අයබදු (පිස්කල්) කටයුතු නිසා ඇතිවූ ප්‍රාසාරණය මුල් තැන ගනු ලැබීය.

මුදල් සැපයුම ප්‍රාසාරණය රුපියල් කෝටි 5.14 කට සීමාකළ ප්‍රධාන සාධකය වූයේ බාහිර ද්‍රවශීලතාවය විශාල වශයෙන් අඩු වී යාමයි. අවසාන කාර්තුවේ දී බැංකු විදේශීය වත්කම් වේග යෙන් සංකෝචනය විය. කාලීන හා ඉතිරිකිරීම් තැන්පතු ද සැලකිය යුතු ප්‍රමාණයකින් වැඩිවිය. එහෙත් මේ නිසා රටතුළ මූල්‍ය තත්ත්වයෙහි ඇති වූ බලපෑම රජයෙන් සහ බැංකු මාර්ගයෙන් කැරුන ප්‍රාසාරණය නිසා නිෂ්ප්‍රභවී ගියේය.

මුල් අඩවස තුළ දී බාහිර ගනු දෙනු උද්ධමනයකට තුඩු දෙනායුරු ක්‍රියාත්මක වූ අතර, දෙවැනි අඩ වස තුළ දී එය ක්‍රියාත්මක වූයේ සංකෝචන බලපෑමක් ඇති කරනායුරෙනි. රාජ්‍ය අංශය මුල් අඩ වසර තුළ එක්තරා සංකෝචන බලපෑමක් ඇති කළේ වුව ද දෙවැනි අඩ වසර තුළ විශේෂයෙන්ම, තෙවැනි කාර්තුවේ දී, දැඩි ප්‍රාසාරණාත්මක බලපෑමක් ඇති කළේය. සුළු බාධක ඇති වුව ද බැංකු ණය දිගටම ප්‍රාසාරණය වෙමින් තුබූ අතර, කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු වැඩිවීම නිසා වසර තුළ ප්‍රාථමික ද්‍රවශීලතාවය එක්තරා ප්‍රමාණයකට සීමා විය.

**1. (ආ) කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු**

1963 දී පෞද්ගලික අංශයේ ස්ථාවර හා ඉතිරි කිරීම් තැන්පතු පරිමාව, රුපියල් කෝටි 84.23 සිට රුපියල් කෝටි 91.16 තෙක් රුපියල් කෝටි 6.93 කින් හෙවත් සියයට 8.2 කින් ඉහළ ගියේය. 1962 දී මේ රුපියල් කෝටි 6.07 කින් හෙවත් සියයට 7.8 කින් වැඩිවිය. පවත්නා සාධක වියදම් මිල අනුව, දළ ජාතික නිෂ්පාදිතයේ අනුපාතයක් වශයෙන් 1963 දී මේ තැන්පතු සියයට 13.1 සිට සියයට 13.5 තෙක් වැඩි වී ඇත. එහෙත් පෞද්ගලික අංශය සතු මුළු ද්‍රවශීල වත්කම්වලට මේ තැන්පතු වල සියයට ගණන 31.8 සිට සියයට 31.0 තෙක් අඩු විය. එසේම ද්විතීයික ද්‍රවශීල වත්කම් වලට එහි වූ කොටස් සියයට 64.4 සිට සියයට 63.7 තෙක් අඩුවිය.

වෙළෙඳ බැංකු සතු කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු රුපියල් කෝටි 6.34 කින් වැඩිවිය. මෙසේ ඉතිරි කිරීම් තැන්පතු රුපියල් කෝටි 2.43 කින් ද කාලීන තැන්පතු රුපියල් කෝටි 3.91 කින් ද වැඩි වූයේ 1963 දී වැඩි වූ මුළු කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු වලින් සියයට 61.7 ක් විය. තැපැල් කන්තෝරු ඉතිරි කිරීම් බැංකුවේ ඉතිරි කිරීම් තැන්පතු රුපියල් කෝටි 0.62 කින් හෙවත් සියයට 1.7 කින් වැඩි වූ අතර, ලංකා ඉතිරි කිරීම් බැංකුව සතු එකී තැන්පතු රුපියල් කෝටි 0.03 කින් හෙවත් සියයට 0.4 කින් අඩුවිය.

මෑත වර්ෂවලදී වෙළෙඳ බැංකු සතු ඉතිරි කිරීම් හා කාලීන තැන්පතු නොකඩවාම වැඩි වූයේ මේ ශේෂයන් කෙසේ වෙනස් වන්නේද යන්න වඩාත් සැලකිලිමත්ව හැදෑරීමේ අවශ්‍යතා වයක් උද්ගත වී ඇත. මෙසේ වැඩිවන ශේෂයන්ගෙන් තැන්පත් කරන්නන් විසින් ඉතිරි කිරීමේ අදහස නිසා කෙතෙක් තැන්පතු වැඩිවී ඇද්ද යන්න ගැන හැඟුමක් ලබා ගැනීමට මේ ශේෂ යන්ගේ වෙනස්වීම් සම්බන්ධයෙන් ලැබී ඇති අත්දැකීම් තවම ප්‍රමාණවත් නොවේ. එහෙත් ලැබී ඇති සංඛ්‍යා තොරතුරු මේ ශේෂ යටත් පිරිසෙයින් මේ ප්‍රාසාරණාත්මක අවධියේදී, තැපැල් කන්තෝරු ඉතිරි කිරීම් බැංකුව වැනි චිරාගත ඉතිරිකිරීම් ආයතන සතු ශේෂ වලින් වෙනස් යැයි යන කල්පිතය හා සැසඳෙන්නේය. ලංකාවේ ඉල්ලුම් තැන්පතු වෙළෙඳ බැංකු වල තිබෙන කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු මෙන් දහගුණයකින් පමණ අස්ථිර බව සත්‍යයකි. එහෙත් 1(ඇ) හි දක්වා ඇති පරිදි 1963 දී වෙළෙඳ බැංකු වල වැඩි වූ කාලීන හා ඉතිරි කිරීම් වගකීම්, සමග එහි භාවිතය ද සියයට 21 කින් වැඩි වී ඇත. තවද ලැබී ඇති සංඛ්‍යා තොරතුරු අනුව, තැපැල් කන්තෝරු ඉතිරි කිරීම් බැංකුවේ ඇති තැන්පතු, සාමාන්‍යයෙන්, සමාජයේ දුප්පත් පංතිය සතු වුවද, වෙළෙඳ බැංකුවල කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු වලට වඩා අට ගුණයේ සිට දහ ගුණය තෙක් පමණ, ස්ථිර බව පෙනී යයි. සමහර විට, වෙළෙඳ බැංකු වල තිබෙන මේ තැන්පතු එදිනෙද වියදම් සඳහා වූ මුදල් වලින් සහ, නියම වශයෙන්ම කැරෙන ඉතිරි කිරීම් වලින් සමන්විත වූවා විය හැකිය. කරුණු මෙසේ වන්නේ නම් එපමණට, ඉල්ලුම් තැන්පතු හා ඉතිරි කිරීම් තැන්පතු අතර, ආර්ථික වශයෙන් ඇති වෙනස, මැකී යන්නේය. කෙසේ හෝ මේ ශේෂයන් වැඩි වෙත්ම එහි ද්‍රවශීලතාව වැදගත් කමින් වැඩි වන්නේය.

## 1. (ඇ) රජයේ ණයපත්

කලින් සඳහන් කළ පරිදි, පෞද්ගලික අංශය[1] සතු රජයේ ණයපත් 1962 රුපියල් කෝටි 39.25 ක් වූයේ 1963 දී රුපියල් කෝටි 5.41 කින් හෙවත් සියයට 13.8 කින් රුපියල් කෝටි 44.66 තෙක් වැඩිවිය. පෞද්ගලික අංශය සතු රජයේ ණයපත්හි එය මුළු ද්‍රවශීල වත්කම් වලට වූ අනුපාතය සියයට 14.8 සිට සියයට 15.2 තෙක් ඉහළ ගියේය. එසේම, මුළු ද්විතියික ද්‍රවශීල වත්කම් වලට වූ අනුපාතය 1963 දී සියයට 30.0 සිට සියයට 31.2 තෙක් ඉහළ ගියේය.

1963 දී රජයේ ණයපත් අයිතියෙහි ඇතිවූ මේ වැඩිවීම ප්‍රධාන වශයෙන්ම විවිධ භාරකාර මණ්ඩල, අර්ථසාධක හා විශ්‍රාම වැටුප් අරමුදල් හා රක්ෂණ අංශය වෙතැති ණයපත් ප්‍රමාණයන් වැඩි වීමෙක් පිළිබිඹු කරයි. පුද්ගලයන් සතු තැන්පතු වැඩි වූයේ රුපියල් කෝටි 0.1 කින් පමණෙකි. 1963 දී රුපියල් කෝටි 5.41 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන්ම ඇතිවූයේ දිගු කාලීන ව කල්පිරෙන අලුත් නිකුතු සඳහා දයක වීමෙනි. කල්පිරීමේ කාලය දිගුවෙත්ම රජයේ ණයපත් වල ද්‍රවශීලතාවය අඩුවෙයි. 1963 දී ණයපත් අනුපාතිකය වැඩිවීමත් සමගම පෞද්ගලික අංශයේ ණයපත් ද්‍රවශීලතාවය ද තරමක් දුරට අඩුවී ඇත. මෙයින් ණයපත් වැඩි වීමෙන් උද්ගත වූ ද්‍රවශීල තාවයෙහි කොටසක් ද මැකී ගියේය.

## 1. (ඈ) පිරිවැටුම් අනුපාතිකය

ඉහත විස්තර කැරුන පරිදි, මුළු ද්‍රවශීලතාවයෙහි, ඇති වූ වර්ධනයත් සමග 1963 දී මුදල් පිරිවැටුම් අනුපාතිකයෙහි ද සැලකිය යුතු වෙනස්කම් සමහරක් ඇති විය.

තැපැල් කන්තෝරු ඉතිරි කිරීම් බැංකුවේ තැන්පත් කැරුන මුදල් වල සාමාන්‍ය ප්‍රමාණය 1963 දී 1962 දීට වඩා රුපියල් කෝටි 1.05 කින් හෙවත් සියයට 3.0 කින් වැඩිවිය. එහෙත් මේ තැන්පතු වල මාසික සාමාන්‍ය පිරිවැටුම් අනුපාතිකය, 1962 දී 0.023 වූයේ 1963 දී 0.021 ක් දක්වා අඩු විය. මෙයින් පිරිවැටුම් අනුපාතිකය සියයට 8.7 කින් අඩු වූ බව පිළිබිඹු වෙයි. වෙළෙඳ බැංකු වල කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු පරිමාව, පසුගිය වසරට වඩා 1963 දී රුපියල් කෝටි 6.47 කින් හෙවත් සියයට 17.5 කින් වැඩි විය. වෙළෙඳ බැංකු වලැති මේ තැන්පතු දෙවර්ගයේ ඒකාබද්ධ මාසික පිරිවැටුම් අනුපාතිකය 0.14 සිට 0.17 තෙක් හෝ සියයට 21.4 කින් වැඩි විය.

වෙළෙඳ බැංකු සේවකයන්ගේ දිග්ගැස්සී ගිය වැඩ වර්ජනය නිසා 1962 මුල් අඩවසරේදී සාමාන්‍ය ඉල්ලුම් තැන්පතු මට්ටමෙහිත්, සාමාන්‍ය මුදල් සැපැයුම් මට්ටමෙහිත් කෘත්‍රිම උද්ධ මනතාවයක් ඇති විය. අවුරුද්දේ සාමාන්‍යය පිළිබිඹු කරන සංඛ්‍යාවක් වශයෙන් 1962 දෙවැනි සමස සඳහා වූ සංඛ්‍යා සාමාන්‍යය වඩාත් සුදුසුය. මේ පදනම අනුව, 1962 දී සාමාන්‍ය ඉල්ලුම් තැන්පතු මට්ටම රුපියල් කෝටි 59.90 ක් වන අතර, මුදල් සැපැයුම රුපියල් කෝටි 130.11 ක් වෙයි. මේ අනුව, 1963 දී ඉල්ලුම් තැන්පතු සාමාන්‍යය රුපියල් කෝටි 6.04 කින් හෙවත් සියයට 10.1 කින් වැඩිවිය. සාමාන්‍ය මාසික පිරිවැටුම් අනුපාතිකය 1962 දී 1.81 වුව ද, 1963 දී 1.72 ක් වීමෙන් සියයට 5 කින් අඩු විය. මේ පදනම ම අනුව මුදල් සැපැයුම් සාමාන්‍යය 1962 දීට වඩා 1963 දී රුපියල් කෝටි 144.55 කින් හෙවත් සියයට 10.1 කින් වැඩි වූ අතර, මුදල් වල ආදයම් ප්‍රවේගය (පවත්නා සාධක වියදම් මිල අනුව වූ දළ ජාතික නිෂ්පාදිතය මුදල් සැපැයුම් සාමාන්‍ය යෙන් බෙදා) 1962 දී 4.93 ක් වූ අතර, 1963 දී සියයට 5.7 කින් 4.65 දක්වා අඩු විය. පිරිවැටුම් අනුපාතිකය මෙසේ අඩු වූයේ එක් අතකින්, ඉහත සඳහන් කැරුන පරිදි රටතුළ ඇති වූ අධික ද්‍රවශීලතාවය නිසා ඊට සමහන් වන පරිදි ගැලපීයාමෙන් හා අනෙක් අතට, ද්‍රවශීලවත්කම් අයිතිය බෙදී යාමේ ඇති වූ වෙනස්කම් නිසා ය.

## 1. (ඉ) පොළී අනුපාතිකය

සමාගම් වල කොටස් වෙනුවෙන් වෙළෙඳ බැංකු අත්තිකාරම් සඳහා වූ අනුපාතිකයන් හැර, සංවිධාන වූ මුදල් වෙළෙඳ පොළේ කෙටි කාලීන පොළී අනුපාතිකයන් 1963 දී නොවෙනස්ව පැවැතිණි. කොටස් වෙනුවෙන් දුන් බැංකු අත්තිකාරම් සඳහා වූ උපරිම පොළී අනුපාතිකය

1. තැපැල් කන්තෝරු ඉතිරි කිරීමේ බැංකුව, ලංකා සේවිංස් බැංකුව, සේවක අර්ථසාධක අරමුදල යනාදි අත්හැර ඇත.

වර්ෂයකට සියයට 8 සිට සියයට 9 දක්වා වැඩි වූ අතර, අවම පොළී අනුපාතිකය සියයට $5\frac{1}{2}$ සිට සියයට 5 දක්වා අඩු විය. කෙසේ වුව ද, සමාගම් කොටස් වෙනුවෙන් ගනු ලබන්නේ ලංකාවේ බැංකු වලින් දෙන මුළු අත්තිකාරම් ප්‍රමාණයෙන් සුළු අනුපාතයක් නිසා (සියයට 5 ක් පමණ) මේ වෙනස්කම් එතරම් සැලකිය යුතු වන්නේ නොවේ.

දිගුකාලීන ණය වෙළෙඳ පොළේ, රුපියල් 10,000 කට නොවැඩි ණය සඳහා ලංකා ඉතිරි කිරීම් බැංකුව විසින් අයකරන ලද පොළී අනුපාතිකය සියයට 4.5 සිට 5.0 තෙක් වැඩිවිය. රු. 10,000 ට වැඩි එහෙත් රු. 40,000 ට අඩු ණය සඳහා පොළිය සියයට 4.5 සිට $5\frac{1}{2}$ දක්වා වැඩි විය. නිවාස ඉදිකිරීම සඳහා ජාතික නිවාස දෙපාර්තමේන්තුවෙන් දෙන ලද හැම ප්‍රමාණයක ම ණය සඳහා පොළිය සියයට $\frac{1}{4}$ කින් වැඩි විය. අළුතෙන් නිකුත් කරන ලද රජයේ ණයපත් සඳහා වූ පොළී අනුපාතිකය ද, 1963 ජූලි මාසයේ දී සියයට $4\frac{1}{4}$ සිට $4\frac{1}{2}$ දක්වා වැඩි කරන ලදී. මේ වෙනසට පසුව අවුරුද්දේ අවසාන කොටසේ දී රජයේ ණයපත් වලින් ලැබෙන ආදායම වැඩි වන අතට හැරිණි.

මෙසේ රටතුළ ද්‍රවශීලතාවය වේගයෙන් වැඩි වුවද, 1963 වර්ෂය පොළී අනුපාතිකය බොහෝ සෙයින් ම ස්ථිරව පැවැති වර්ෂයක් විය. මේ සඳහා ආනයන රටාවෙහි ඇති වූ ගැටීම මුදල් වෙළෙඳ පොළේ ඌනතාවය, ආනයන වෙළෙඳාමෙහි ආයෝජනය කිරීමට ඇති අවස්ථාවන් අඩුවී යාමත් සමග වණික් ගණයාගේ ආනයන භාණ්ඩ මිල දී ගැනීමේ අවස්ථාවක් අඩුවී ගිය නිසා පාරිභෝගික ගණයාත් මුදල් ලඟ තබා ගැනීමට වැඩියෙන් දක්වූ කැමැත්ත යන කරුණු මේ සඳහා බලපෑවා විය හැකිය. ඉහත වැටිසන් කොට ඇති පරිදි, විශේෂයෙන් අවුරුද්දේ අවසාන භාගයේ දී, දිගු කාලීන පොළී අනුපාතිකය, තරමක් ස්ථාවර වූ ලෙසක් දක්ක හැකි විය.

**2. වෙළෙඳ බැංකු කටයුතු**

1963 වසර වෙළෙඳ බැංකු කටයුතු දිගටම පුළුල් වෙමින් තුබුන වසරක් විය. එසේම තැන්පතු වැඩිවීමත්, පෞද්ගලික අංශයට දෙන ලද අත්තිකාරම් වැඩිවීමත්, බැංකු ශාඛා තවදුරටත් වැඩිවීමත්, මේ වසරේ විශේෂාංගයන් විය. බැංකු වලට තැන්පතු මාර්ගයෙන් ලැබුන මුළු මුදල 1962 දී ඒ මාර්ගයෙන් ලැබුන මුදලට වඩා වැඩිවිය. පෞද්ගලික අංශයට දෙන ලද ණය බොහෝ සෙයින්ම වැඩිවිය. එහෙත් 1962 දී මෙන් නොව බැංකු සතු රජයේ සුරකුම්වල වැඩි වීමෙක් ඇති නොවිනි. වැඩි වූ බැංකු කටයුතු බොහෝ සෙයින්ම බැංකු ක්‍රමයේ ලාංකික අංශයට සීමා විය. බැංකු අත්තිකාරම් බොහෝ සෙයින් වැඩිවී යාම නිසා බැංකු වල ද්‍රවශීල වත්කම් මඳක් අඩු වුවද එය බොහෝ සෙයින්ම නොවෙනස්ව පැවැතිණි.

**2. (අ) බැංකු ශාඛා**

1963 දී මහජන බැංකුව අලුත් බැංකු කාර්යාල හතක් විවෘත කළ අතර, ලංකා බැංකුව කාර්යාල තුනක් විවෘත කිරීමෙන්, දිවයිනෙහි මුළු වෙළෙඳ බැංකු කාර්යාල ගණන අසූ තුනකට ගෙනෙන ලදී. 1963 දී ඇරඹුන බැංකු කාර්යාල කොළඹ, යාපනය, මීගමුව, අවිස්සාවේල්ල, අම්බලන්ගොඩ, කන්කසන්තුරේ, ඒකල, මාතර සහ හපුතලේ පිහිටියේ විය. මෙකී කාර්යාල දහයෙන් අටක් කොළඹින් පිට පිහිටා ඇති අතර, පහක් මෙතෙක් බැංකු පහසුකම් නොතිබුන නගරවල පිහිටියේය.

1963 වන විට දිවයිනේ තුබුන බැංකු කාර්යාල අසූතුනෙන් පනස් හතක්ම කොළඹින් පිට පිහිටා තුබූ අතර, කාර්යාල හැටහතක්ම ලාංකික බැංකු ශාඛා විය. ලාංකික බැංකුවල ශාඛා පනස් දෙකක්ම කොළඹින් පිට පිහිටා ඇත. 1962 දී ජනගහනයෙන් 1,43,041 කට එක් බැංකු කාර්යාලයක් වූ අතර 1963 දී 1,29,060කට බැංකු කාර්යාලයක් විය. මෑතදී බැංකු කටයුතු පුළුල් වී ගියද තවමත් කොළඹින් පිට පිහිටා තිබෙන බැංකු කාර්යාල ගණන ජාතික අවශ්‍යතාවන් පිරිමසාලන තරමට ප්‍රමාණවත් නොවේ. අලුත් ශාඛා විවෘත කිරීමේ වැඩ පිළිවෙල මෙන්ම දනට විවෘත කර ඇති ශාඛා වඩාත් ශක්තිමත් කිරීම ද අවධාරණයෙන්ම කළ යුතුව ඇත්තේය. අලුත් පෙදෙස් වලට සහ, අලුත් ආර්ථික හා සමාජයීය පන්ති වලට සීඝ්‍රයෙන් බැංකු පහසුකම් සලසාදීම මෑත වර්ෂවලදී මූල්‍ය අංශයේ ඇතිවූ සැලකිය යුතු දියුණුවක් විය. තවමත් බැංකු පහසුකම් නොමැති පෙදෙස්වලට බැංකු පහසුකම් නිසැකයෙන්ම සලසා දිය යුතුව ඇත්තේ වුවද වෙළෙඳ බැංකු වලින් පමණක් සංකීර්ණ ප්‍රශ්නයක් වූ ගැමියාට ණය දීමේ ප්‍රශ්නය සතුටුදායක ලෙස විසඳා ලිය හැක්කේ නොවේ. මේ සමගම සමූපකාර ණයදෙන ක්‍රමය, විශේෂයෙන්ම එහි මූලික අවස්ථාවන් දියුණු කර ගැනීම අවශ්‍යයෙන්ම සිදුවිය යුත්තකි.

මුළු බැංකු කාර්යාල ගණන ලාංකික, බ්‍රිතාන්‍ය, ඉන්දියානු සහ අනෙකුත් බැංකු අතර බෙදී ගිය අයුරුත් ඒ ඒ බැංකු අතර, බැංකු තැන්පතු බෙදී ගිය අයුරුත් පහත II ඉ—7 වැනි සංඛ්‍යා සටහනේ දක්වා ඇත.

සංඛ්‍යා සටහන II ඉ—7

### 1961-63, බැංකු කාර්යාල හා තැන්පතු බෙදී ගිය අයුරු

| | මුළු ගණන | | | ලාංකික බැංකු | | | බ්‍රිතාන්‍ය බැංකු | | | ඉන්දියානු සහ අනෙකුත් බැංකු | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | තැන්පතු | | | තැන්පතු | | | තැන්පතු | | | තැන්පතු | |
| | කාර්යාල ගණන | ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ | % | කාර්යාල ගණන | ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ | % | කාර්යාල ගණන | ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ | % | කාර්යාල ගණන | ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ | % |
| 1961 | 54 | 1041 | 100 | 37 | 503 | 48 | 12 | 467 | 45 | 5 | 71 | 7 |
| 1962 | 73 | 1182 | 100 | 57 | 683 | 58 | 12 | 429 | 36 | 4 | 70 | 6 |
| 1963 | 83 | 1301 | 100 | 67 | 801 | 61 | 12 | 412 | 32 | 4 | 88 | 7 |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

**2. (ආ) මූල්‍ය ධන මාර්ග, ලැබෙන අයුරු හා යෙදවූ අයුරු**

1963 දී වෙළෙඳ බැංකුවල මූල්‍ය ධන මාර්ග සහ ඒ යෙදවූ අයුරු ඊට පෙර අවුරුද්දේ සංඛ්‍යා සමග සසඳා II ඉ—8 වැනි සංඛ්‍යා සටහනේ දක්වා ඇත.

සංඛ්‍යා සටහන II ඉ—8

### 1960-63 බැංකු ධනමාර්ග වල ඇති වූ වෙනස්කම් සහ ඒවා යෙද වූ අයුරු

රුපියල් දශ ලක්ෂ

| | 1961 | 1962 | 1963 |
|---|---|---|---|
| මුදල් මාර්ග | | | |
| **1. රාජ්‍ය අංශය** .. .. .. .. .. .. | — | **84·8** | **14·8** |
| ණය වැඩිවීම .. .. .. .. .. | — | 5·0 | — |
| රජයේ සුරැකුම්පත් අඩුවීම .. .. .. | — | — | 5·5 |
| තැන්පතු වැඩිවීම .. .. .. .. .. | — | 79·8 | 9·3 |
| **2. මහ බැංකුවෙන් ණය ගැනීම වැඩිවීම** | — | — | **37·9** |
| **3. දේශීය පෞද්ගලික අංශය** .. .. .. .. .. | **80·0** | **125·0** | **115·3** |
| තැන්පතු වැඩිවීම .. .. .. .. .. | — | 82·4 | 109·9 |
| සංචිත හා ගෙවනලද ප්‍රාග්ධන ආදිය වැඩිවීම | 8·8 | 7·5 | 5·4 |
| අනෙකුත් වගකීම් වැඩිවීම .. .. .. | 71·2 | — | — |
| අනෙකුත් වත්කම් අඩුවීම .. .. .. | — | 35·1 | — |
| **4. විදේශීය අංශය** .. .. .. .. .. .. | **10·0** | **5·6** | **8·2** |
| විදේශීය ශේෂ අඩුවීම .. .. .. .. .. | 10·0 | 5·6 | 8·2 |
| **5. දේශීය මුදල් ශීර්ෂ අඩුවීම** .. .. .. | **35·4** | — | **1·1** |
| වැඩි වූ මුළු ධන මාර්ග .. .. .. .. | **125·4** | **215·4** | **177·3** |
| මුදල් පාවිච්චිය | | | |
| **1. රාජ්‍ය අංශය** .. .. .. .. .. .. | **35·5** | **71·4** | — |
| ණය අඩුවීම .. .. .. .. .. .. | 2·0 | — | — |
| රජයේ සුරැකුම්පත් වැඩිවීම .. .. .. | 21·4 | 71·4 | — |
| තැන්පතු අස්කර ගැනීම .. .. .. .. | 12·1 | — | — |
| **2. මහ බැංකු ණය ගැනීම අඩුවීම** .. .. .. | **0·4** | **20·6** | — |
| **3. දේශීය පෞද්ගලික අංශය** .. .. .. .. | **89·4** | **88·1** | **176·1** |
| තැන්පතු අස්කර ගැනීම .. .. .. .. | 21·2 | — | — |
| අත්තිකාරම් වැඩිවීම .. .. .. .. .. | 19·0 | 41·2 | 136·8 |
| අනෙකුත් වගකීම් අඩුවීම .. .. .. | — | 46·9 | 1·5 |
| අනෙකුත් වත්කම් වැඩිවීම .. .. .. | 49·2 | — | 37·8 |
| **4. විදේශීය අංශය** .. .. .. .. .. .. | **2·9** | **4·2** | **1·3** |
| ණය අඩුවීම .. .. .. .. .. .. | 0·6 | 3·5 | 0·6 |
| තැන්පතු අස්කර ගැනීම .. .. .. .. | 2·3 | 0·7 | 0·7 |
| **5. දේශීය මුදල් ශීර්ෂ වැඩිවීම** .. .. .. | — | **30·6** | — |
| පාවිච්චි කළ මුදලේ එකතුවෙහි වැඩිවීම .. .. | **128·2** | **214·9** | **177·4** |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

1963 දී බැංකු වලට හැම මාර්ගයකින්ම ලැබුන කාරක ධන මාර්ග රුපියල් කෝටි 17.73කින් වැඩි විය. මෙයින් රුපියල් කෝටි 1.48ක් රාජ්‍ය අංශයෙන් ද (තැන්පතු වශයෙන් හා බැංකු සතු ආයෝජන අඩු කිරීමෙන්) රුපියල් කෝටි 3.79 ක් මහ බැංකුවෙන් ගත් ණය වලින් ද රුපියල් කෝටි 10.99ක් මෙරටට පෞද්ගලික තැන්පතු යෙදවීමෙන් ද ලබාගන්නා ලදී. බැංකු සතු විදේශීය ශේෂයන් ද රුපියල් කෝටි 0.82කින් අඩු කැරිණි. මේ අනුව, 1963 දී මෙරට පෞද්ගලික තැන්පතු පසුගිය වසරට වඩා විශාල ලෙස වැඩට ගනු ලැබීය. එහෙත් රජයේ තැන්පතු බොහෝ සෙයින් අඩුවිය. මෙසේ වැඩිවූ ධන මාර්ග පෞද්ගලික අංශයට දෙනලද අත්තිකාරම් රුපියල් කෝටි 13.68කින් හා ස්ථාවර හා විවිධ වත්කම් රුපියල් කෝටි 3.78කින් වැඩි කිරීමට, ප්‍රධාන වශයෙන්ම, යොදවන ලදී. 1963 වැඩිවූ ධන මාර්ග යෙදවූ පිළිවෙළ 1962 වසරේදී යෙදවූ පිළිවෙළට වඩා වෙනස් විය. 1962 දී මේ මුදල් වලින් රුපියල් කෝටි 7.14ක් රජයේ ණයපත් වලද, රුපියල් කෝටි 4.69 ක් 'අනෙකුත්' වගකීම් අඩුකර ගැනීමට ද රුපියල් කෝටි 4.12 ක් අත්තිකාරම් වැඩිකර ගැනීමට ද රුපියල් කෝටි 3.06 ක් මුදල් තැන්පතු වැඩි කර ගැනීමට ද, යොදවන ලදී.

1962 දී මෙන්ම 1963 දී වැඩි වූ තැන්පතු මුළුමනින්ම වාගේ ලාංකික බැංකු වලට ගොනු විය. එහෙත් විදේශීය බැංකු සතු තැන්පතු රුපියල් කෝටි 3.9කින් අඩුවූ පසුගිය වසරේ මෙන් නොව 1963 දී විදේශීය බැංකු සතු තැන්පතුද සුළු වශයෙන් වැඩිවිය. 1963 දී පෞද්ගලික අංශයට දෙන ලද ණය බොහෝ සෙයින් වැඩිවීමෙන් සම්පූර්ණයෙන් නොවූවත් ප්‍රධාන වශයෙන් ම ලාංකික බැංකු කටයුතු වල වැඩිවීමක් පිළිබිඹු වෙයි.[1]

## 2. (ඇ) බැංකු වගකීම් සැකසුම

වෙළෙඳ බැංකුවල වත්කම් හා වගකීම් බෙදී ගිය අන්දම ගැන විග්‍රහයක් පරිශිෂ්ටයේ 4 වැනි සංඛ්‍යා සටහන පදනම් කොට සකසා II ඉ—9 වැනි සංඛ්‍යා සටහනේ දක්වා ඇත. මේ සංඛ්‍යා සටහනින් වත්කම් හා වගකීම් පිළිබඳ මාසික සාමාන්‍යයන්, දැක්වෙන අතර, 1962 සහ 1963 වර්ෂාවසාන සංඛ්‍යා තොරතුරු ද දැක්වෙයි. 1962 මුල් භාගයේදී දිගටම පැවැති වෙළෙඳ බැංකු සේවක වැඩ වර්ජනය හේතු කොට මාසික සංඛ්‍යා සාමාන්‍යයන් වෙනස් වී ගිය නිසා වර්ෂාවසාන සංඛ්‍යා ඇතුළත් කිරීම අවශ්‍ය වී ඇත. විග්‍රහයන් සඳහා මේ අවුරුදුවල මාසික සංඛ්‍යා සාමාන්‍ය වලට වඩා වර්ෂාවසාන සංඛ්‍යා වැදගත් වෙයි.

1963 දී බැංකු ක්‍රමයේ මුළු වගකීම් (සහ වත්කම්) රුපියල් කෝටි 14.88කින් හෙවත් සියයට 10.8කින්, රුපියල් කෝටි 137.96 සිට රුපියල් කෝටි 152.84 දක්වා වැඩි විය. 1962 දී වැඩිවූයේ රුපියල් කෝටි 11.75 කින් හෙවත් සියයට 9.3 කිනි. 1963 දී ඇති වූ වෙනස්කම් ප්‍රධාන වශයෙන්ම, ඇතිවූයේ තැන්පතු වගකීම් වැඩිවීමෙන් (රුපියල් කෝටි 11.88 කින් හෝ සියයට 10.0 කින්) සහ වෙළෙඳ බැංකු මහ බැංකුවෙන් ගෙන ඇති ණය (රුපියල් කෝටි 3.79 කින්) වැඩිවීමෙනි. මුළු වගකීම් වලට වූ මුළු තැන්පතු අනුපාතය 1962 දී සියයට 85.7ක් වුවද 1963 දී එය සියයට 85.1 තෙක් අඩුවිය.

තැන්පතු වගකීම් සැකැසුම ද 1963 එක්තරා ප්‍රමාණයකට වෙනස් විය. වෙළෙඳ බැංකු වෙතැති රජයේ තැන්පතු—මේ තැන්පතු වල පිරිවැටුම් අනුපාතිකය, පෞද්ගලික තැන්පතු වලට වඩා බොහෝ සෙයින් වැඩිය—රුපියල් කෝටි 0.93 කින් හෙවත් සියයට 6.3 කින් පමණක් වැඩි වූ අතර අනෙකුත් තැන්පතු රුපියල් කෝටි 10.95 කින් හෙවත් සියයට 10.6කින් වැඩිවිය. මුළු තැන්පතු වලට වූ රජයේ තැන්පතු අනුපාතය 1962 දී සියයට 12.5ක් වූ අතර 1963 වන විට සියයට 12.1 තෙක් අඩුවිය. මුළු ඉල්ලුම් තැන්පතු පරිමාව—රජයේ සහ පෞද්ගලික—

1. 1961 මුදල් පනතේ විධිවිධාන වලට අනුව ලාංකිකයින් සහ සමාගම් වලින් අරඹන ගිණුම් 1961 ජූලි 27 වැනි දින සිට ලාංකික බැංකුවල ඇරඹිය යුතුය.

සංඛ්‍යා සටහන II ඉ—9

## වෙළෙඳ බැංකුවල වත්කම් හා වගකීම් බෙදී ගිය අයුරු

(මාසික සංඛ්‍යා සාමාන්‍ය)

රුපියල් දශ ලක්ෂ

| | 1952 | 1953 | 1954 | 1955 | 1956 | 1957 | 1958 | 1959 | 1960 | 1961 | 1962 | 1963 | 1962 දෙසැ. | 1963 දෙසැ. |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| අතැති මුදල් හා මහ බැංකුවේ ඇති තැන්පතු (ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතා ඇතුළුව) .. .. .. | 177 | 128 | 106 | 149 | 148 | 139 | 119 | 116 | 132 | 148 | 186 | 164 | 171 | 170 |
| විදේශීය ශේෂ .. .. .. .. .. | 97 | 44 | 55 | 112 | 116 | 72 | 50 | 52 | 58 | 54 | 55 | 44 | 41 | 32 |
| භාණ්ඩාගාර බිල් .. .. .. .. .. | 39 | 55 | 60 | 51 | 39 | 34 | 16 | 24 | 28 | 51 | 89 | 128 | 111 | 104 |
| වට්ටම්කළ හා අනෙකුත් බිල් .. .. .. | 64 | 65 | 73 | 94 | 93 | 100 | 116 | 119 | 115 | 122 | 136 | 114 | 117 | 164 |
| මුළු ද්‍රවශීල වත්කම් .. .. .. .. | 377 | 292 | 294 | 406 | 396 | 345 | 301 | 311 | 333 | 375 | 466 | 450 | 440 | 471 |
| මුළු ආයෝජන (1) .. .. .. .. | 235 | 235 | 221 | 245 | 291 | 308 | 296 | 285 | 284 | 290 | 303 | 313 | 317 | 318 |
| මුළු ලෝන හා අයිරාවන් .. .. .. .. | 176 | 182 | 208 | 244 | 273 | 340 | 363 | 395 | 430 | 435 | 477 | 495 | 447 | 545 |
| ඉල්ලුම් තැන්පතු (2) .. .. .. .. | 653 | 573 | 562 | 675 | 731 | 721 | 661 | 655 | 657 | 677 | 829 | 789 | 756 | 802 |
| කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු .. .. .. | 95 | 102 | 126 | 190 | 206 | 240 | 263 | 300 | 340 | 359 | 380 | 460 | 426 | 499 |
| මුළු තැන්පතු .. .. .. .. .. | 754 | 677 | 689 | 869 | 941 | 965 | 926 | 955 | 998 | 1036 | 1209 | 1250 | 1182 | 1301 |
| අනුපාතය .. .. .. .. .. | % | % | % | % | % | % | % | % | % | % | % | % | % | % |
| ඉල්ලුම් තැන්පතු වලට වූ මුදල් .. .. .. | 27·1 | 22·3 | 18·9 | 22·1 | 20·2 | 19·3 | 18·0 | 17·7 | 20·1 | 21·9 | 22·4 | 20·8 | 22·6 | 21·2 |
| මුළු තැන්පතු වලට වූ මුදල් .. .. .. | 23·5 | 18·9 | 15·4 | 17·1 | 15·7 | 14·4 | 12·9 | 12·1 | 13·2 | 14·3 | 15·4 | 13·1 | 14·5 | 13·1 |
| මුළු තැන්පතු වලට වූ විදේශීය ශේෂ .. .. .. | 12·9 | 6·5 | 8·0 | 12·9 | 12·3 | 7·5 | 5·4 | 5·4 | 5·8 | 5·2 | 4·5 | 3·5 | 3·5 | 2·5 |
| මුළු තැන්පතු වලට වූ භාණ්ඩාගාර බිල් .. .. | 5·2 | 8·1 | 8·7 | 5·9 | 4·1 | 3·5 | 1·7 | 2·5 | 2·8 | 4·9 | 7·4 | 10·2 | 9·4 | 8·0 |
| මුළු තැන්පතු වලට වූ වට්ටම් කළ වාණිජ බිල් .. .. | 8·5 | 9·6 | 10·6 | 10·8 | 9·9 | 10·4 | 12·5 | 12·5 | 11·5 | 11·8 | 11·2 | 9·1 | 9·9 | 12·6 |
| ඉල්ලුම් තැන්පතු වලට වූ ද්‍රවශීල වත්කම් .. .. | 57·7 | 50·9 | 52·3 | 60·1 | 54·2 | 47·9 | 45·5 | 47·5 | 50·7 | 55·4 | 56·2 | 57·0 | 58·2 | 58·8 |
| මුළු තැන්පතු වලට වූ ද්‍රවශීල වත්කම් .. .. | 50·0 | 43·1 | 42·7 | 46·7 | 42·1 | 35·8 | 32·5 | 32·6 | 33·4 | 36·2 | 38·5 | 36·0 | 37·2 | 36·2 |
| මුළු තැන්පතු වලට වූ ආයෝජන .. .. .. | 31·2 | 34·7 | 32·1 | 28·2 | 39·9 | 31·9 | 32·0 | 29·8 | 28·5 | 28·0 | 25·1 | 25·0 | 26·8 | 24·4 |
| මුළු තැන්පතු වලට වූ ලෝන හා අයිරාවන් .. .. | 23·3 | 26·9 | 30·2 | 28·1 | 29·0 | 35·2 | 39·2 | 41·4 | 43·1 | 42·0 | 39·4 | 39·6 | 37·8 | 41·9 |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

(1) රජය හා රජය ඇප වූ සුරැකුම්පත්, සහ මහ බැංකු නිකුතු

(2) දේශීය අන්තර් බැංකු තැන්පතු ඇතුළත් නැත.

රුපියල් කෝටි 4.60 කින් හෙවත් සියයට 6.1 කින් වැඩි වූ අතර කාලීන හා ඉතිරිකිරීම් තැන්පතු රුපියල් කෝටි 7.28 කින් හෙවත් සියයට 17.1 කින් වැඩි විය. මුළු තැන්පතු වලට වූ ඉල්ලුම් තැන්පතු අනුපාතය සියයට 63.9 සිට සියයට 61.6 තෙක් අඩුවිය. ඉහත 1 (ඈ) කොටසින් සාකච්ඡා කළ පරිදි ඉල්ලුම් තැන්පතු පිරිවැටුම් අනුපාතිකයේ ඇතිවූ අඩුවීම හැර, මෑත කාලයේදී දක්වන ලද පරිදි 1963 දී තැන්පතු වගකීම් වල කල් පිරෙන පිළිවෙළ වෙනස්වෙමින් තුබුනේ දිගු කාලීන වශයෙන් කැරෙන තැන්පතු අතට ඒ වඩාත් බර විය.

අර්ධ වාර්ෂිකව මහ බැංකුවෙන් කැරෙන සමීක්ෂණය පදනම් කොටගෙන බැංකු තැන්පතු අයිතිය බෙදී ගිය අයුරු විග්‍රහ කොට IIඉ—10 වැනි සංඛ්‍යා සටහනේ දක්වා ඇත. මෑත වර්ෂවලදී බැංකු තැන්පතු අයිතිය බෙදී යෑමේ දී දක්නට ලැබුන විශේෂ ලක්ෂණයක් වූ වතුවල තැන්පතු අඩුවීමත්, වාණිජ කටයුතු සම්බන්ධ බැංකු ශේෂ බොහෝ සෙයින් වැඩි වීමත් 1963 දී ද එලෙසම පැවැතිණි. පුද්ගලයන් සතු තැන්පතු රුපියල් කෝටි 3.67 කින් වැඩිවිය. මූල්‍ය ආයතන සහ අනෙකුත් ව්‍යාපාර සතු තැන්පතු අඩු වූ අතර, අනෙකුත් හැම ගණයකටම අයත් තැන්පතු වැඩි විය.

සංඛ්‍යා සටහන II ඉ—10

## තැන්පතු අයිතිය

රුපියල් දශ ලක්ෂ

| අයිතිකරු | ඉල්ලුම් | | කාලීන | | ඉතිරි කිරීම් | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රමාණය | % | ප්‍රමාණය | % | ප්‍රමාණය | % | ප්‍රමාණය | % |
| **මූල්‍ය ආයතන** | | | | | | | | |
| 1962 දෙසැම්බර් .. | 48·8 | 7·9 | 68·3 | 26·8 | 4·9 | 3·5 | 122·0 | 12·0 |
| 1963 ජූනි .. | 43·6 | 6·9 | 59·6 | 23·0 | 6·1 | 4·1 | 109·2 | 10·5 |
| 1963 දෙසැම්බර් .. | 46·7 | 7·0 | 64·9 | 21·8 | 5·4 | 3·3 | 117·0 | 10·4 |
| **වැවිලි** | | | | | | | | |
| 1962 දෙසැම්බර් .. | 89·8 | 14·6 | 43·7 | 17·0 | 1·0 | 0·7 | 134·6 | 13·3 |
| 1963 ජූනි .. | 74·5 | 11·8 | 31·9 | 12·3 | 0·8 | 0·5 | 107·2 | 10·3 |
| 1963 දෙසැම්බර් .. | 76·3 | 11·5 | 38·8 | 13·0 | 0·7 | 0·4 | 115·8 | 10·3 |
| **වෙළෙඳාම** | | | | | | | | |
| 1962 දෙසැම්බර් .. | 100·5 | 16·3 | 20·7 | 8·1 | 2·0 | 1·4 | 123·2 | 12·2 |
| 1963 ජූනි .. | 139·9 | 22·1 | 24·4 | 9·4 | 2·5 | 1·7 | 166·8 | 16·0 |
| 1963 දෙසැම්බර් .. | 146·5 | 22·1 | 40·2 | 13·5 | 1·6 | 1·0 | 188·2 | 16·7 |
| **අනෙකුත් ව්‍යාපාර** | | | | | | | | |
| 1962 දෙසැම්බර් .. | 93·2 | 15·1 | 39·2 | 15·4 | 3·1 | 2·2 | 135·5 | 13·4 |
| 1963 ජූනි .. | 82·4 | 13·0 | 19·4 | 7·5 | 4·5 | 3·0 | 106·3 | 10·2 |
| 1963 දෙසැම්බර් .. | 72·3 | 10·9 | 45·2 | 15·1 | 4·0 | 2·4 | 121·5 | 10·8 |
| **පළාත් පාලන ආයතන** | | | | | | | | |
| 1962 දෙසැම්බර් .. | 13·2 | 2·1 | 17·7 | 6·9 | 0·2 | 0·1 | 31·1 | 3·1 |
| 1963 ජූනි .. | 25·8 | 4·1 | 38·8 | 14·9 | 0·2 | 0·1 | 64·8 | 6·2 |
| 1963 දෙසැම්බර් .. | 29·9 | 4·5 | 17·5 | 5·9 | 0·3 | 0·2 | 47·7 | 4·2 |
| **ව්‍යාපාර නොවන ආයතන** | | | | | | | | |
| 1962 දෙසැම්බර් .. | 38·2 | 6·2 | 13·7 | 5·4 | 3·1 | 2·2 | 55·0 | 5·4 |
| 1963 ජූනි .. | 37·9 | 6·0 | 25·3 | 9·7 | 4·0 | 2·7 | 67·2 | 6·4 |
| 1963 දෙසැම්බර් .. | 50·6 | 7·6 | 33·4 | 11·2 | 2·9 | 1·8 | 86·9 | 7·7 |
| **පුද්ගලයන්** | | | | | | | | |
| 1962 දෙසැම්බර් .. | 233·4 | 37·8 | 52·0 | 20·4 | 126·2 | 89·9 | 411·6 | 40·6 |
| 1963 ජූනි .. | 229·6 | 36·2 | 60·1 | 23·2 | 132·0 | 87·9 | 421·8 | 40·4 |
| 1963 දෙසැම්බර් .. | 240·7 | 36·3 | 58·2 | 19·5 | 149·3 | 90·9 | 448·3 | 39·8 |
| **එකතුව** | | | | | | | | |
| 1962 දෙසැම්බර් .. | 617·0 | 100·0 | 255·3 | 100·0 | 140·6 | 100·0 | 1012·9 | 100·0 |
| 1963 ජූනි .. | 633·6 | 100·0 | 259·5 | 100·0 | 150·2 | 100·0 | 1043·3 | 100·0 |
| 1963 දෙසැම්බර් .. | 662·9 | 100·0 | 298·3 | 100·0 | 164·2 | 100·0 | 1125·4 | 100·0 |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

**2. (ඈ) බැංකු වත්කම් සැකසුම**

ඉහත 2(ඇ) කොටසේ සඳහන් කළ පරිදි බැංකුවල වගකීම් සැකසුමේ මැතදී ඇතිවූ වෙනස් කම් නිසාත්, ලාංකික බැංකු මාර්ගයෙන් ණය දෙන ආයතන මාලාව පුළුල් කිරීම නිසාත්, 1963 දී බැංකු වත්කම් සැකැසුමෙහි සහ පරිමාවෙහි සැලකිය යුතු වෙනස්කම් ඇතිවිය.

මුළු බැංකු වත්කම් පරිමාව, රුපියල් කෝටි 14.88කින් හෙවත් සියයට 10.8කින් වැඩි වූයේ ප්‍රධාන වශයෙන්ම, ණය සහ අයිරාවන් රුපියල් කෝටි 9.75කින් හෙවත් සියයට 21.8කින් වැඩිවීම නිසාය. වෙළෙඳ බිල් සහ එකතු කෙරීගෙන යන කාසි, රුපියල් කෝටි 2.16කින් (හෙවත් සියයට 18.5) සහ රුපියල් කෝටි 1.77 කින් (හෙවත් සියයට 27.5) පිළිවෙළින් වැඩි විය. බැංකු ඔවුන්ගේ ස්ථාවර සහ අනෙකුත් විවිධ වත්කම් රුපියල් කෝටි 3.78 කින් හෙවත් සියයට 56.9කින් වැඩි කළේය. මුදල් ශේෂ, විදේශීය ශේෂ සහ භාණ්ඩාගාර බිල් සුළු වශයෙන් අඩුවිය.

මුළු වත්කම් වලට පැවැති ණය සහ අයිරාවන් අනුපාතය 1962 දී සියයට 32.4 ක් වූයේ 1963 වන විට සියයට 35.6 තෙක් වැඩි විය. බැංකු අත්තිකාරම් සැකැස්ම ද දිගු කාලීන අතට බරව, හැඩගැසී ගිය බවට සාක්ෂි ඇත. රජයේ ණයපත් අයිතිය 1962 දී සියයට 23.0ක් වුවද 1963 දී එය සියයට 20.8 තෙක් අඩුවිය. 1963 අවසානය වන විට, රජයේ මුළු රුපියල් ණයපත් පරිමාවෙන් සියයට 18.3ක් වෙළෙඳ බැංකු සතුව තිබිණි. 1962 දී මෙය සියයට 20.2 ක් විය. බැංකු වල මුදල් ශේෂ එහි මුළු වත්කම්වල සමානුපාතිකයක් වශයෙන් සියයට 12.4 සිට සියයට 11.1 තෙක් අඩුවිය. ඔවුන්ගේ ද්‍රවශීල වත්කම්—එකතු කෙරීගෙන යන මුදල් ශේෂ ද ඇතුළුව— සියයට 36.6 සිට සියයට 36.2 තෙක් අඩු විය.

**2. (ඉ) පෞද්ගලික අංශයට බැංකු ණය**

පෙබරවාරි, මාර්තු සහ ඔක්තෝබර් යන මාසවල දී හැර, පෞද්ගලික අංශයට දෙන ලද බැංකු ණය 1963 වසර පුරාම වැඩිවිය. අවුරුද්දේ මුල් කාර්තුවේදී රුපියල් කෝටි 1.03ක අඩුවීමක් ඇතිවිය. එහෙත් අවුරුද්දේ ඉතිරි කාර්තු වලදී රුපියල් කෝටි 5.01කින් රුපියල් කෝටි 3.88 කින් හා රුපියල් කෝටි 4.05කින් වැඩි විය.

වසර තුළදී ණය රුපියල් කෝටි 4.53 කින්ද අයිරාවන් රුපියල් කෝටි 5.22 කින් ද අපනයන බිල් රුපියල් කෝටි 1.20කින්ද, ආනයන බිල් රුපියල් කෝටි 1.25 කින්ද එකතු කෙරීගෙන යන මුදල් ශීර්ෂ රුපියල් කෝටි 1.77 කින්ද, වැඩිවිය. එකතු කෙරීගෙන යන ශීර්ෂ රුපියල් කෝටි 1.77කින් වැඩිවූයේ, සහතික මිල ක්‍රමය යටතේ, මෙරට හාල් ගනුදෙනු සඳහා ලාංකික බැංකු මගින් දෙනලද කෙටි කාලීන ණය බොහෝ සෙයින් වැඩිවීම නිසාය.

විදේශීය බැංකු ප්‍රධාන වශයෙන් අයිරා මාර්ගයෙන් දෙන ලද මුළු අත්තිකාරම් රුපියල් කෝටි 2.36කින් වැඩි කළ අතර, ලාංකික බැංකු ප්‍රධාන වශයෙන් ණය සහ අයිරා මාර්ගයෙන් දෙන ලද අත්තිකාරම් රුපියල් කෝටි 11.33 කින් වැඩි කළේය. ලාංකික බැංකු වලින් දෙන ලද අත්තිකාරම් ප්‍රමාණය මුළු අත්තිකාරම් වලින්, 1962 දී සියයට 47.7ක් වූ අතර, 1963 දී එය සියයට 54.0ක් විය. 1963 දී ලාංකික බැංකු වලින් දෙන ලද අත්තිකාරම් වලින් සැහෙන ප්‍රමාණයක් සමුපකාර සමිති වලට දෙන ලද වැඩි වූ ණය පහසුකම් පිළිබිඹු කැරිණි. නගර බද හා ගම්බද ආයතන නොවන මාර්ග වලින් දෙන ණය වෙනුවට දුන් ණය ද මෙයට එක් සාධකයක් විය. ලාංකික හා විදේශීය බැංකු වලින් දෙන ලද ණය, ණය වර්ග අනුව වර්ග කොට, II ඉ—11 වැනි සංඛ්‍යා සටහනේ දක්වා ඇත.

සංඛ්‍යා සටහන II ඉ—11

## වෙළෙඳ බැංකු අත්තිකාරම්, 1962 දෙසැම්බර්/1963 දෙසැම්බර්

රුපියල් දශ ලක්ෂ

| | ලාංකික බැංකු | | | විදේශීය බැංකු | | | සියලු බැංකු | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 1962 දෙසැම්. | 1963 දෙසැම්. | වෙනස | 1962 දෙසැම්. | 1963 දෙසැම්. | වෙනස | 1962 දෙසැම්. | 1963 දෙසැම්. | වෙනස |
| (අ) එකතු කෙරීගෙන යන මුදල් ශීර්ෂ .. | 61·1 | 79·6 | + 18·5 | 3·2 | 2·5 | − 0·7 | 64·4 | 82·1 | + 17·7 |
| (ආ) මෙරට බිල් .. .. | — | — | — | 6·6 | 3·7 | − 2·9 | 6·6 | 3·7 | − 2·9 |
| (ඇ) ආනයන බිල් .. | 15·5 | 28·4 | + 12·9 | 34·1 | 33·7 | − 0·4 | 49·6 | 62·1 | + 12·5 |
| (ඈ) අපනයන බිල් .. | 8·5 | 11·1 | + 2·6 | 52·3 | 61·7 | + 9·4 | 60·8 | 72·8 | + 12·0 |
| (ඉ) අයිරාවන් .. | 87·1 | 119·7 | + 32·6 | 192·6 | 212·2 | +19·6 | 279·7 | 331·9 | + 52·2 |
| (ඊ) ණය .. .. | 127·8 | 174·6 | + 46·8 | 39·8 | 38·4 | − 1·4 | 167·7 | 213·0 | + 45·3 |
| එකතුව .. | 300·0 | 413·4 | +113·3 | 328·6 | 352·2 | +23·6 | 628·7 | 765·6 | +136·9 |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

සමීක්ෂණයේ සංඛ්‍යා තොරතුරු පදනම් කොටගෙන අරමුණ හා කල්පිරෙන කාලය අනුව බැංකු අත්තිකාරම් වර්ග කොට, IIඉ—12 වැනි සංඛ්‍යා සටහනේ දක්වා ඇත. 1963 දී වාණිජ කටයුතු සඳහා දෙන ලද මුළු බැංකු අත්තිකාරම් රුපියල් කෝටි 7.60 කින් වැඩි විය. අපනයන වෙළෙඳාමට දෙන ලද අත්තිකාරම් රුපියල් කෝටි 4.64 කින් ද ආනයන අත්තිකාරම් රුපියල් කෝටි 0.38 කින් ද අනෙකුත් අත්තිකාරම් රුපියල් කෝටි 3.08කින් ද වැඩි විය. මූල්‍ය කටයුතු සහ පාරිභෝගික කටයුතු සඳහා දෙන ලද අත්තිකාරම් රුපියල් කෝටි 1.52කින් හා රුපියල් කෝටි 1.29කින් අඩු විය. කෘෂිකර්මයට දෙන ලද අත්තිකාරම් රුපියල් කෝටි 0.88කින් වැඩි විය. මෙයින් තේ වගාවට දෙන ලද අත්තිකාරම් රුපියල් කෝටි 0.33කින් ද, කිරිපට්ටි—පශු වගාව ඇතුළු අනෙකුත් කෘෂි භෝග සඳහා දෙනලද අත්තිකාරම් රුපියල් කෝටි 0.58කින්ද වැඩිවීම පිළිබිඹු වෙයි. කාර්මික කටයුතු සඳහා දුන් අත්තිකාරම් රුපියල් කෝටි 1.73කින් වැඩි විය. ඉංජිනේරු හා ගොඩනැගිලි කර්මාන්ත අත්තිකාරම් රුපියල් කෝටි 0.72 කින්ද අනෙකුත් කටයුතු සඳහා දෙනලද අත්තිකාරම් රුපියල් කෝටි 1.57 කින්ද වැඩිවිය. විවිධ කටයුතු සඳහා දෙනලද අත්තිකාරම් රුපියල් කෝටි 5.03 කින් වැඩි විය. බැංකු අත්තිකාරම් වල කල්පිරීම සැකසී ගිය අන්දමේ ද වෙනසක් ඇතිවිය. මාස හයකට අඩුවෙන් දෙන ලද ණය

සංඛ්‍යා සටහන II ඉ—12

## *කරුණු අනුව හා කල්පිරීම් අනුව වර්ග කැරුණු අත්තිකාරම්

| කාරණාව | කෙටි කාලීන (මාස 6 ට අඩු) | | මැදි කාලීන (මාස 6 මාස 30) | | දිගු කාලීන (මාස 30 ට වැඩි) | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|
| | (1) | (2) (1) (7) සියයට ගණන වශයෙන් | (3) | (4) (3) (7) සියයට ගණන වශයෙන් | (5) | (6) (5) (7) සියයට ගණන වශයෙන් | (7) | (8) (7) එකතු-වෙහි සියයට ගණන වශයෙන් |
| **(අ) වෙළෙඳ** | | | | | | | | |
| 1962 දෙසැම්බර් .. | 153·8 | 40·9 | 170·0 | 45·3 | 51·8 | 13·8 | 375·6 | 66·3 |
| 1963 ජූනි .. | 138·1 | 37·1 | 176·3 | 47·3 | 58·4 | 15·7 | 372·7 | 61·6 |
| 1963 දෙසැම්බර් .. | 196·0 | 43·4 | 182·4 | 40·4 | 73·2 | 16·2 | 451·6 | 65·4 |
| **(ආ) මූල්‍ය** | | | | | | | | |
| 1962 දෙසැම්බර් .. | 24·1 | 27·9 | 39·2 | 45·4 | 23·0 | 26·7 | 86·3 | 15·2 |
| 1963 ජූනි .. | 27·0 | 30·3 | 39·5 | 44·4 | 22·5 | 25·3 | 89·0 | 14·7 |
| 1963 දෙසැම්බර් .. | 18·7 | 26·3 | 26·1 | 36·7 | 26·4 | 37·1 | 71·1 | 10·3 |
| **(ඇ) කෘෂිකාර්මික** | | | | | | | | |
| 1962 දෙසැම්බර් .. | 5·9 | 34·9 | 4·0 | 23·7 | 7·0 | 41·4 | 16·9 | 3·0 |
| 1963 ජූනි .. | 6·4 | 28·4 | 6·3 | 28·0 | 9·7 | 43·1 | 22·5 | 3·7 |
| 1963 දෙසැම්බර් .. | 5·9 | 23·0 | 5·7 | 22·2 | 14·2 | 55·2 | 25·7 | 3·7 |
| **(ඇ) කාර්මික** | | | | | | | | |
| 1962 දෙසැම්බර් .. | 5·0 | 19·2 | 12·8 | 49·0 | 8·3 | 31·8 | 26·1 | 4·6 |
| 1963 ජූනි .. | 7·2 | 20·5 | 15·9 | 45·3 | 12·0 | 34·2 | 35·1 | 5·8 |
| 1963 දෙසැම්බර් .. | 8·6 | 19·8 | 16·7 | 38·5 | 18·0 | 41·5 | 43·4 | 6·3 |
| **(ඉ) පාරිභොජනය** | | | | | | | | |
| 1962 දෙසැම්බර් .. | 12·8 | 25·9 | 17·0 | 34·3 | 19·7 | 39·8 | 49·5 | 8·7 |
| 1963 ජූනි .. | 15·5 | 24·9 | 21·1 | 33·9 | 25·6 | 41·2 | 62·2 | 10·3 |
| 1963 දෙසැම්බර් .. | 7·7 | 21·0 | 10·0 | 27·3 | 19·0 | 51·9 | 36·6 | 5·3 |
| **(ඊ) අනෙකුත් ණය** | | | | | | | | |
| 1962 දෙසැම්බර් .. | 3·6 | 31·0 | 3·7 | 31·9 | 4·2 | 36·2 | 11·6 | 2·0 |
| 1963 ජූනි .. | 9·7 | 40·4 | 8·0 | 33·3 | 6·3 | 26·3 | 24·0 | 4·0 |
| 1963 දෙසැම්බර් .. | 29·7 | 48·0 | 7·1 | 11·5 | 25·1 | 40·5 | 61·9 | 9·0 |
| **(උ) එකතුව** | | | | | | | | |
| 1962 දෙසැම්බර් .. | 205·3 | 36·3 | 246·8 | 43·6 | 114·0 | 20·1 | 566·1 | 100·0 |
| 1963 ජූනි .. | 203·8 | 33·7 | 267·1 | 44·1 | 134·5 | 22·2 | 605·4 | 100·0 |
| 1963 දෙසැම්බර් .. | 266·6 | 38·6 | 247·9 | 35·9 | 175·9 | 25·5 | 690·4 | 100·0 |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

*අත්තිකාරම්වලට ණය, අයිරාවන් සහ වට්ටම්කළ බිල් ඇතුළත්. (එකතු කෙරිගෙන යන මුදල් ශීර්ෂ ඇතුළත් නැත).

සියයට 36.3 සිට සියයට 38.6 තෙක් වැඩි විය. මාස 6 සිට 30 දක්වා වර්ගයේ ණය සියයට 43.6 සිට සියයට 35.9 තෙක් අඩු විය. අවුරුදු 2½ට වැඩි කාලයකට දෙන ලද ණය 1962 දී සියයට 20.1 සිට 1963 දී සියයට 25.5 තෙක් වැඩි විය.

වෙළෙඳ බැංකු වලින් පෞද්ගලික අංශයට දුන් ණය ඇපවශී අනුව වර්ගකොට, IIඉ—13 වැනි සංඛ්‍යා සටහනේ දක්වා ඇත. මේ අනුව, සමාගම් කොටස් සහ රජයේ සුරැකුම් පත් ඇපයට තබාගෙන දී ඇති ණය අඩුවී ඇති අතර, අනෙකුත් හැම ඇප වර්ගයක්ම වෙනුවෙන් දී ඇති ණය 1963 දී ප්‍රාසාරණය විය. වෙළෙඳ තොග හා ලේඛනගත බිල් ඇපයට තබාගෙන දෙනලද ණය 1962 දෙසැම්බරයේ දී මුළු ණයෙන් සියයට 48.7ක් වූ අතර 1963 දෙසැම්බරයට දී ඇති මුළු ණය වලින් සියයට 49.5ක් විය.

සංඛ්‍යා සටහන II ඉ—13

## අත්තිකාරම්*—ඇප වර්ග අනුව

| ඇප වර්ගය | 1962 දෙසැම්බර් 31 | | 1963 ජූනි 30 | | 1963 දෙසැම්බර්. 31 | |
|---|---|---|---|---|---|---|
| | ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ | එකතුවේ %ට ගණන | ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ | එකතුවේ %ට ගණන | ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ | එකතුවේ %ට ගණන |
| ලේඛනගත බිල් .. .. .. | 135·1 | 23·9 | 118·4 | 19·6 | 141·5 | 20·5 |
| රජයේ සුරැකුම්පත් .. .. .. | 12·7 | 2·2 | 11·9 | 2·0 | 5·9 | 0·8 |
| බද්ධ ව්‍යාපාර වස්තු සමාගම් කොටස් .. | 31·2 | 5·5 | 30·5 | 5·0 | 18·6 | 2·7 |
| කාලීන හා ඉතිරිකිරීම් තැන්පතු හා අනෙකුත් මුදල් තැන්පතු (ජීවිත රක්ෂණ ඔප්පුවල වටිනාකම ඇතුළුව) .. | 26·9 | 4·8 | 33·3 | 5·5 | 30·9 | 4·5 |
| වෙළෙඳ තොග .. .. .. | 140·8 | 24·9 | 149·8 | 24·7 | 200·6 | 29·0 |
| නිශ්චල දේපොළ .. .. .. | 50·3 | 8·9 | 58·8 | 9·7 | 68·8 | 10·0 |
| අනෙකුත් .. .. .. | 99·3 | 17·5 | 129·9 | 21·5 | 133·5 | 19·3 |
| ඇප රහිත .. .. .. | 69·8 | 12·3 | 72·9 | 12·0 | 90·7 | 13·1 |
| එකතුව .. .. .. | 566·1 | 100·0 | 605·4 | 100·0 | 690·4 | 100·0 |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

*එකතු කෙරීගෙන යන මුදල් ශීර්ෂ ඇතුළත් නැත.

1963 දී වැඩි වූ ණය වලින් වැඩි කොටසක් සඳහා සියයට 6 සහ 7 වාර්ෂික පොළිය නියමිතව තුබූ බව, IIඉ—14 වැනි සංඛ්‍යා සටහනින් හෙළිවෙයි. ගෙවීමට ඉතිරිව ඇති ණය වලින් වැඩි කොටසක් සියයට 6ක වාර්ෂික පොළියක් ලැබෙන ණය විය. එහෙත් මුළු ණයවලින් සියයට

සංඛ්‍යා සටහන II ඉ—14

## පොළී අනුපාතික අනුව අත්තිකාරම්*

| පොළී අනුපාතිකය % | 1962 දෙසැ. 31 | | 1963 ජූනි 30 | | 1963 දෙසැ. 31 | |
|---|---|---|---|---|---|---|
| | ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ | එකතුවේ %ට ගණන | ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ | එකතුවේ %ට ගණන | ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ | එකතුවේ %ට ගණන |
| 2½ට අඩු .. .. .. | 3·3 | 0·7 | 4·4 | 0·8 | 4·8 | 0·8 |
| 2½ .. .. .. .. | ... | ... | 0·6 | 0·1 | 0·3 | ... |
| 3 .. .. .. .. | 1·6 | 0·3 | 2·2 | 0·4 | 1·4 | 0·2 |
| 3½ .. .. .. .. | 5·4 | 1·1 | 5·0 | 0·9 | 15·3 | 2·5 |
| 4 .. .. .. .. | 8·8 | 1·7 | 11·9 | 2·2 | 2·0 | 0·3 |
| 4½ .. .. .. .. | 12·9 | 2·5 | 17·0 | 3·2 | 10·7 | 1·7 |
| 5 .. .. .. .. | 31·6 | 6·2 | 29·9 | 5·6 | 52·0 | 8·4 |
| 5½ .. .. .. .. | 17·2 | 3·4 | 13·6 | 2·6 | 12·3 | 2·0 |
| 6 .. .. .. .. | 240·0 | 47·4 | 244·5 | 46·1 | 273·3 | 44·2 |
| 6½ .. .. .. .. | 34·5 | 6·8 | 30·4 | 5·7 | 27·9 | 4·5 |
| 7 .. .. .. .. | 130·0 | 25·7 | 152·9 | 28·8 | 169·6 | 27·4 |
| 7½ .. .. .. .. | 9·9 | 2·0 | 7·4 | 1·4 | 5·8 | 0·9 |
| හා ඊට 8 ට වැඩි .. .. .. | 11·0 | 2·2 | 11·1 | 2·1 | 43·3 | 7·0 |
| එකතුව .. | 506·2 | 100·0 | 530·9 | 100·0 | 618·8 | 100·0 |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

*දනට පවත්නා විනිමය අනුපාතික අනුව මිලට ගත් ආනයන බිල් හා එකතු කෙරී ගෙන යන මුදල් ශීර්ෂ අඩු කොට ඇත.

6ක පොළියක් ලබන ණය සමානුපාතිකව අඩු විය. 1962 දී එය මුළු ණයෙන් සියයට 47.4ක් වූ අතර 1963 දෙසැම්බරයේ දී එය සියයට 44.2 තෙක් අඩුවිය. සියයට 7ක වාර්ෂික පොළියක් ලබන ණය මුළු ණය වලින් සියයට 25.7 සිට සියයට 27.4 තෙක් වැඩි විය. සියයට 4, සියයට 6½ සහ සියයට 7½ පොළී ලබන ණය ප්‍රමාණයන් සමානුපාතික වශයෙන් ද අඩුවිය.

### 3. ඉතිරි කිරීම් සහ දිගු කාලීන ණය දෙන ආයතන

දිගු කාලීන ණය දෙන ආයතන වල, 1961 සිට 1963 දක්වා වූ ණය ගනුදෙනු වර්ග කොට IIඉ—15 වැනි සංඛ්‍යා සටහනේ දක්වා ඇත.

සංඛ්‍යා සටහන II ඉ—15

**දිගුකාලීන ණය දෙන ආයතනයන්හි ණය ගනුදෙනු**

රුපියල් දහස් ගණනින්

| | 1961 | | 1962 | | 1963 | |
|---|---|---|---|---|---|---|
| | දෙන ලද ණය | නොබේරූ ප්‍රමාණය | දෙන ලද ණය | නොබේරූ ප්‍රමාණය | දෙන ලද ණය | නොබේරූ ප්‍රමාණය |
| සංවර්ධන මුදල් සමායතනය* .. .. | 4,318 | 20,931 | 3,555 | 22,841 | 1,864 | 23,072 |
| ලංකා ඉතිරිකිරීමේ බැංකුව .. .. | 2,435 | 10,302 | 2,801 | 11,635 | 3,339 | 13,387 |
| කෘෂිකාර්මික හා කාර්මික ණය සමායතනය | 2,905 | 30,706 | 2,477 | 29,874 | 3,334 | 29,501 |
| රජයේ උකස් බැංකුව .. .. | 5,442 | 56,994 | 2,553 | 55,785 | 3,135 | 55,119 |
| ණය මණ්ඩලය .. .. .. | 2,284 | 11,937 | 1,660 | 12,309 | 1,033 | 12,203 |
| ජාතික නිවාස දෙපාර්තමේන්තුව** .. | 13,880 | ල. නො. | 9,799 | ල. නො. | 9,208 | ල. නො. |
| එකතුව .. .. .. | 31,264 | 130,870 | 22,845 | 1,32,444 | 21,913 | 133,282 |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

* සාමාන්‍ය කොටස් ගැනීමට ඇතුළති.
** මුදල් වර්ෂය ඔක්තෝබර්/සැප්තැම්බර්.
** දෙපාර්තමේන්තු වැඩ ඇතුළත්ය.

මේ සංඛ්‍යා සටහනින් දැක්වෙන පරිදි, සංවර්ධන මුදල් සමායතනය, ලංකා ඉතිරි කිරීමේ බැංකුව, කෘෂිකාර්මික හා කාර්මික ණය දෙන ආයතනය, රජයේ උකස් බැංකුව, ණය මණ්ඩලය, සහ ජාතික නිවාස දෙපාර්තමේන්තුව යන ආයතන වලින් 1963 දී ඇති මුළු ණය ප්‍රමාණය, රුපියල් කෝටි 2.19ක් වන අතර 1962 මුළු ණය ප්‍රමාණය රුපියල් කෝටි 2.28 ක් විය. ජාතික නිවාස දෙපාර්තමේන්තුව හැර ඉහත සඳහන් අනෙකුත් ආයතන වලට ගෙවීමට ඉතිරිව ඇති මුළු ණය ප්‍රමාණය 1962 දෙසැම්බරයේ දී රුපියල් කෝටි 13.24 ක් වූ. අතර 1963 වන විට එය රුපියල් කෝටි 13.33 තෙක් වැඩි විය.

සංඛ්‍යා සටහන II ඉ—16

**ඉතිරි කිරීම් තැන්පතු සහ ඉතිරි කිරීම් සහතික**

රුපියල් දශ ලක්ෂ

| | 1962 දෙසැම්බර් | 1963 දෙසැම්බර් | '62 දෙසැම්බර් '63 දෙසැම්බර් වෙනස |
|---|---|---|---|
| තැපැල් කන්තෝරු ඉතිරි කිරීමේ බැංකුව .. .. | 362·3 | 368·5* | + 6·2* |
| ලංකා ඉතිරිකිරීමේ බැංකුව .. .. .. .. | 75·4 | 75·1* | — 0·3* |
| වෙළෙඳ බැංකු (කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු)** .. | 426·4 | 499·2 | + 72·8 |
| නොබේරා ඇති ඉතිරි කිරීම් සහතික .. .. .. | 32·9 | 34·4 | + 1·5 |
| එකතුව .. .. .. .. .. | 897·0 | 977·2* | + 80·2* |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

* තාවකාලිකයි.
** රජයේ තැන්පතු ඇතුළති.

වෙළෙඳ බැංකු වල, තැපැල් කන්තෝරු ඉතිරි කිරීමේ බැංකුවේ සහ ලංකා ඉතිරි කිරීමේ බැංකුවේ ස්ථාවර තැන්පතු, ඉතිරි කිරීම් හා ඉතිරි කිරීම් සහතික මුළු පරිමාව 1963 රුපියල් කෝටි 89.70 සිට රුපියල් කෝටි 97.72 තෙක් රුපියල් කෝටි 8.02 කින් වැඩිවිය. පසුගිය වසරේ වැඩි වූයේ රුපියල් කෝටි 7.33 කිනි. 1963 දී සේවක අර්ථසාධක අරමුදලට එකතු වූ මුළු ප්‍රමාණය රුපියල් කෝටි 5.85 ක් වූ අතර 1962 දී එය රුපියල් කෝටි 5.77 ක් විය.